# 2026 ජනවාරි මාසයට අදාලව 2026.01.22 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2026.01.22
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.12.05 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව හා 2025.12.16 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2026.01.14 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තා මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් ගරු සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා, 2025.12.05 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව හා 2025.12.16 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2025.12.05 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව හා 2025.12.16 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**02.01. බිබිල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම.**

අංක 2458/44 හා 2025 ඔක්තෝබර් මස 16 වැනි බ්‍රහස්පතින්දා දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රය මගින් බිබිල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කළ බව ගරු සභාවට නිවේදනය කරන ලදී.

**02.02.පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සහ ස්වයං උත්පාදන ආදායම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා වූ ණය මුදල් සඳහා අය කෙරෙන පොළී ප්‍රතිශත සංශෝධනය කිරීම.**

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පළාත් පාලන ආයතන වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සහ ඒ ඒ පළාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදායම වැඩි දියුණු කිරීම සඳහා මුදල් වෙළඳපොලේ පොළී ප්‍රතිශත වලට වඩා අඩු ප්‍රතිශතයකට මූල්‍ය පහසුකම් සැලසීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිහිටුවා ඇත.

මෙම අරමුදල මගින් කොළඹ මහ නගර සභාව හැර අනෙකුත් පළාත් පාලන ආයතන රාශියකට පසුගිය වසර 109 තුළ ණය මුදල් ලබාදී ඒ ඒ පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු ඉටුකර ඇති දේශීය ණය සහ සංවර්ධන අරමුදල රජයේ ජාතික ප්‍රතිපත්තිවලට ගැළපෙන ආකාරයට ණය යෝජනා ක්‍රම සකස් කර මේ වනවිට පළාත් පාලන ආයතන වලට ලබා දෙමින් පවතී. ඒ ඒ පළාත්වල පිහිටි පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු උසස් මට්ටමකට ගෙන ඒම සඳහා මෙම ණය මුදල් ලබාදීම සිදු කරනු ලබයි.

රජයේ සංවර්ධන වැඩසටහන උසස් මට්ටමකට පවත්වාගෙන යාමේ අරමුණින් 2025 ඔක්තෝබර් මස පැවති දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් ණය යෝජනා ක්‍රම රාශියක් අලුතින් හඳුන්වා දී ඇති අතර , ඊට අමතරව ණය යෝජනා ක්‍රමවල පැවති පොළී ප්‍රතිශතයන්ද ඒ ඒ ව්‍යාපෘතිවල ස්වභාවය , ඒවායේ ජාතික වැදගත්කම සහ පළාත් පාලන ආයතනවල ආදායම් වැඩි කිරීම ආදී කරුණු සලකා සංශෝධනය කර ඇත. එකී සංශෝධිත ප්‍රතිශතවල විස්තර මෙයට යා කර ඇත.

මේ අනුව ඔබගේ පළාත් පාලන ආයතනවල සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය මුදල් ලබාදීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදල බලාපොරොත්තු වන බැවින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ඔබ දිස්ත්‍රික්කයට අදාළ දිස්ත්‍රික් සංවර්ධන නිලධාරි සහ පළාත් පාලන කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීමෙන් මෙම ණය ඉතා කඩිනමින් ලබා ගතහැකි බවද දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් දන්වා එවා ඇති බව නිවේදනය කරන ලදී.

**02.03. 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබාගෙන ඇති එළගවමස් වෙළඳසැල පිහිටි කඩකාමරය අංක 01 කුකුළු මස් වෙළඳසැල පිහිටි කඩකාමරයට මාරු කිරීම සඳහා**

බිබිල, කණුල්වෙල, එච්.එම්.නසීර් මහතා 2026 වර්ෂය සඳහා බිබිල එළ ගවමස් වෙළඳසැල බඳු ලබාගෙන ඇත.මෙම වෙළඳසැල පිහිටි කඩකාමරය අපිරිසිදු බැවින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු බලපත්‍රය නිකුත් කිරීමට අකමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඒ වෙනුවට අංක 01 කුකුළු මස් වෙළඳසැළ පිහිටි කඩ කාමරය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව නිවේදනය කරන ලදී.

**02.04. බිබිල ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ කාර්ය සාධන විගණන වාර්තාවඉදිරිපත් කිරීම.**

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේදී ජාතික විගණන කාර්යාලය මගින් සිදුකළ කාර්ය සාධන විගණන පරීක්ෂාව සම්බන්ධයෙන් සෝදිසි විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු තහවුරු කර ගැනීම සඳහා තොරතුරු කැඳවීමක් සිදුකරන බවත් ඒ සඳහා පිළිතුරු ලබා දෙන ලෙසත් ජාතික විගණන

කාර්යාලය මගින් UPLG/MG/A/BBLPS/2025/කා.සා./22 හා 2026 ජනවාරි 06 දිනැතිව දන්වා ඇති තොරතුරු ගරු මන්ත්‍රී මණ්ඩලයේ දැන ගැනීම පිණිස නිවේදනය කරන ලදී.

මෙම විගණන තොරතුරු සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

මෙම කාර්ය සාධන විගණන වාර්තාව ගරු මූලාසනයට සභාවට ඉදිරිපත් කිරීමට විශාල කාලයක් වැයවූ බැවින් මෙවැනි වාර්තා ගොනුගත කරතැබීම සුදුසු බවත් එවිට සභාවේ මූලාසන යෝජනා සාකච්ඡා කිරීමට කාලය ඉතිරි වන බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමාගේ එම අදහසට තමාද එකඟ වන බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය.</u>

ජාතික විගණන කාර්යාලය මගින් එවා ඇති විගණන වාර්තාවෙහි බිබිල ප්‍රාදේශීය සභාවට අයත් Acted කඩ කාමර බඳු ලබා ගෙන ඇති ව්‍යාපාරිකයින් ගෙන් සම්පූර්ණ කීමනි මුදල ගෙවන ලද ව්‍යාපාරිකයින් 05 දෙනෙකු සිටින බැවින් එම ව්‍යාපාරිකයින් 05 දෙනාට මේ වන විට එම ව්‍යාපාරික ස්ථානය අහිමි වී ඇති බැවින් ඒ අයට ව්‍යාපාර පවත්වාගෙන යාමට ස්ථාන 05ක් ලබා දීමට සුදුසු බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා.</u>

එම Acted කඩ කාමර සඳහා සම්පූර්ණ කීමනි ගෙවන ලද ව්‍යාපාරිකයින් හට සතිපොළෙන් ව්‍යාපාරික ස්ථාන ලබා දුන්නද එම ගොඩනැගිල්ල කිසියම් ව්‍යාපාරික කටයුත්තකට යොදා ගැනීමට අවශ්‍ය බවත් එම ස්ථානයෙහි මස් මාළු ව්‍යාපාර සඳහා යොදා ගැනීමට සුදුසු බවත් පැවසීය. එම ස්ථානය 2026 ජනවාරි 01 වනදා පිරිසිදු කිරීමේ කටයුතු සිදු කළ බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

මේ වන විට මස් මාළු කඩ තිබෙන ස්ථානයෙන් සතිපොළ තිබෙන ස්ථානයට රැගෙන යාමට සාකච්ඡා මට්ටමේ පවතින බැවින් එම Acted ගොඩනැගිල්ල සඳහා රැගෙන යාමට හැකිදැයි විමසන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

Acted ගොඩනැගිල්ලේ කීමනි මුදල් ගෙවා අවසන් කරන ලද ව්‍යාපාරිකයින් 05 දෙනා සඳහා සති පොළෙහි ඉහළ මාලයේ E කඩ කාමර ලබාදීමට සුදුසු බවත් මස් මාළු වෙළඳසැල් Acted ගොඩනැගිල්ල වෙත රැගෙන ඒමට කටයුතු කිරීම සුදුසු බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා</u>

ඉදිරියේදී සතිපොළ නැවත බෙදා වෙන් කිරීමට බලාපොරොත්තු වන බැවින් , එම සතිපොළෙන් Acted ගොඩනැගිල්ලේ සම්පූර්ණ කීමනි මුදල්ගෙවන ලද ව්‍යාපාරිකයින් හට ස්ථාන ලබාදී Acted ගොඩනැගිල්ලට මස් මාළු කඩ රැගෙන ඒම සුදුසු බව පැවසීය. පොළෙන් බඩු මිලදී ගන්නා පාරිභෝගිකයින් මස් මාළු ගැනීම සඳහා එම ස්ථානයට යනු ඇතැයි විශ්වාස කරන බවද පැවසීය.

**ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය**

සතිපොළෙහි ව්‍යාපාර කටයුතුවල නියුක්ත වන වෙළඳුන් තම ව්‍යාපාරික ස්ථානය අපිරිසිදුව පවත්වාගෙන යන්නේ නම් ඒ අය සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන් යොදවා දඩමුදලක් නියම කිරීමට අවස්ථාව දියයුතු බවත් , ඒ අයට තරයේ අවවාද කළයුතු බවත් පැවසූ අතර Acted ගොඩනැගිල්ලේ සම්පූර්ණ කීමනි ගෙවූ ව්‍යාපාරිකයින් 05 දෙනා හට සතිපොළ අලුතින් බෙදා වෙන් කිරීමේදී ඉදිරි පෙළින්ම ස්ථානයක් ලබාදීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බව පැවසීය.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

Acted ගොඩනැගිල්ලේ ව්‍යාපාර කටයුතු සිදුකළ සම්පූර්ණ කීමනි මුදල් ගෙවන ලද ව්‍යාපාරිකයින් හට සතිපොළ නැවත බෙදීමේ කටයුතු සිදුකරන අවස්ථාවකදී ව්‍යාපාරික ස්ථාන ලබාදිය හැකි බවත් දැනට ඒ අයට සතිපොළෙහි පිටුපසින් ව්‍යාපාරික ස්ථාන ලබාදීමට අවස්ථාව තිබුණද එසේ ලබාදීම ඒ අයට කරන අසාධාරණයක් බව පැවසීය.

Acted කඩකාමර මස් මාළු වෙළඳාම් කටයුතු කිරීමට යොදා ගැනීම සඳහා එම ගොඩනැගිල්ල නැවත එම වෙළඳාමට සුදුසු ආකාරයට ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතු බවත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ද මෙම මස් මාළු වෙළඳසැල් සතිපොළ දෙසට රැගෙන යාමට සැලසුම් කරමින් සිටින බැවින් ද එම ව්‍යාපාරයට සුදුසු බව පැවසීය. කෙසේ වුවද මෙම ගොඩනැගිල්ල පිළිබඳව කාර්මික නිළධාරීන්ද ගොස් නිරීක්ෂණය කළයුතු බවත් ඉන්පසු එය සුදුසු බව තීරණය වුවහොත් එම මස් මළු කඩවලට ගැළපෙන ආකාරයට ගොඩනැගිල්ලෙහි වෙනස් කිරීම් සිදුකොට ගලිවලවල් ඉදිකොට පිවිසුම් මාර්ග සකස් කොට එම ස්ථානයට රැගෙන ඒමට කටයුතු කරමු යැයි පැවසීය.

සතිපොළ උඩුමහළෙහි පිහිටා ඇති E කඩකාමරවල කීමනි මුදල වැඩි බැවින් එම Acted ගොඩනැගිල්ලෙහි සිටි ව්‍යාපාරිකයින් 05 දෙනා හට E කඩකාමර ලබා ගැනීමට හැකියාව ඇත්දැයි සොයා බැලියයුතු බව පැවසීය.

Acted ගොඩනැගිල්ල වෙත මස් මාළු කඩ ගෙන ඒමට සුදුසු ස්ථානයක් දැයි කාර්මික නිළධාරිගෙන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිළධාරීන්ගෙන් වාර්තාවක් ගෙන ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කර තීරණයක් ගැනීමට කටයුතු කරන බව ගරු සභාවට නිවේදනය කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.01.පවතින ස්ථානයෙන් සතිපොළ ඉවත් කිරීම පිළිබඳව විරෝධය පළ කිරීමයි.

තම ප්‍රධාන ජීවිකාව සතිපොළෙහි වෙළඳාම් කටයුතු මගින් සිදුකර ගන්නා අපගේ ජීවනෝපාය වෙනුවෙන් නගරයේ වෙන්වූ එකම බිම්කඩ වනුයේ බිබිල සතිපොළයි. වසර ගණනාවක් තිස්සේ විවිධ හේතූන් මත ප්‍රාදේශීය සභාවේ නියෝගයන්ට එකඟ වෙමින් ස්ථාන 9ක් වෙත මෙම සතිපොළ රැගෙන ගිය අතර දැනට වසරකට පමණ පෙර අභිනවයෙන් විවෘත වූ දැනට සතිපොළ පවත්වාගෙන යන ගොඩනැගිල්ල අප වෙත වෙළඳාම් කටයුතු සිදුකර ගැනීමට ලබාදුන් අතර එම ගොඩනැගිල්ල මනා නිමාවකින් යුතුව හොඳ තත්වයේ පවතින ගොඩනැගිල්ලකි.

වසරකට පමණ පසුව නැවත එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කළයුතු බව පවසමින් නැවතත් වෙළඳුන් මෙන්ම පාරිභෝගිකයින් ද අපහසුතාවයට පත්වන ලෙස මෙම ගොඩනැගිල්ලේ පහත මාලයේ පිහිටි

රථ ගාල වෙත සතිපොළ රැගෙන යායුතු බවට ප්‍රාදේශීය සභාව මගින් සතිපොළ වෙළඳුන් දැනුවත් කර ඇත. ජල කාන්දුවීම සහිත රථගාල හරහා ජලය ගලා යාමෙන් ඉතාමත් අපිරිසිදු හා අප්‍රසන්න ස්වභාවයක් සහිත එම භූමියට නැවතත් සතිපොළ රැගෙන යෑමට විරුද්ධත්වය ප්‍රකාශ කර ව්‍යාපාරිකයින්ගේ අත්සන් වලින් යුක්තව අත්සන් ලේඛනයක් ඉදිරිපත් කර ඇත.

වසරක් පමණ පැරණි දැනට සතිපොළ පැවති ගොඩනැගිල්ලේ යම් අලුත්වැඩියා කටයුත්තක් සිදුකිරීමට අවශ්‍ය නම් කොටස් වශයෙන් අපගේ වෙළදාම් කටයුතු අත්හිටුවා එය අලුත්වැඩියා කටයුතු සිදු කරන ලෙසද ඉල්ලා සතිපොළ වෙළඳ සංගමය විසින් ඉල්ලීමක් කර ඇතිබව  ගරු සභාවට දන්වා සිටින ලදී.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**</u>

බිබිල සතිපොළ මේවන විට අපිරිසිදුව පවතින බවත් එබැවින් මෙම ගොඩනැගිල්ලෙහි පොළොවෙහි තීන්ත ආලේප කිරීමටත් එහි බිත්තිවල ඉහළ කොටසෙහි තීන්ත ආලේප නොකර අඩි 5කින් පමණ පහළට තීන්ත ආලේප කිරීමටත් පිවිසුම් මාර්ග ඉදිකිරීමටත් පඩි පෙළවල් තාමත් කොන්ක්‍රීට් දැමූ ආකාරයටම පවතින බැවින් ඒ සඳහා සිමෙන්ති දැමීමට අවශ්‍ය බවත් පැවසීය.

මෙම වෙළඳුන් මෙම තීන්ත ආලේප කිරීමේ කාර්ය කොටසින් කොටස වෙළඳුන් ඉවත් කර සිදු කිරීමට ඉල්ලීම් කළද එවිට එම කාලය සඳහා ව්‍යාපාරිකයින් හට ආදායම් අහිමිව යන බැවින් කිසිසේත්ම එසේ සිදු කළ නොහැකි බව පැවසීය.

සතිපොළ පෙර තිබූ ස්ථානය වූ පහත මාලයට ගෙනයනු ලබන්නේ සතිපොළ විධිමත් කිරීම සඳහා බවත් මෙම පෙත්සම සඳහා ව්‍යාපාරිකයින්  අත්සන් කර ඇත්තේ අවබෝධයකින් ද, අනවබෝධයකින්ද , එසේත් නැතිනම් කිසියම් බලපෑමක් නිසාදැයි ව්‍යාපාරිකයින්ගෙන් තනි තනිව අදහස් ගැනීමට කටයුතු කළයුතු බව පැවසීය.

මෙම සතිපොළ අලුත්වැඩියා කර  ඉතා විධිමත් ලෙස විනයානුකූලව ,පිරිසිදුව සදාචාරාත්මකව පවත්වාගෙන යාමට නැවත බෙදා වෙන් කිරීමක් සිදු කොට පාරිභෝගික ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කොට ව්‍යාපාරිකයින්ගේ ආදායම ඉහළ නැංවීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය.

සතිපොළ අලුත්වැඩියා කරන තෙක් වෙළෙඳුන් පහත මාලයට ගෙනයනු ලබන්නේ වැස්ස නොමැති කාලයක බවත් සතිපොළ අලුත්වැඩියා කිරීමෙන් පසුව නැවත පොළ බෙදා ව්‍යාපාරිකයින්ට අසාධාරණයක් නොවන ආකාරයට බෙදාදීමෙන් පසුව පොළ ඉදිරිපිට වාහන තදබදය අඩු කිරීම සඳහා පහත මාලය වාහන අංගනයක් බවට පත් කරන බව පැවසීය.

ඒ.එම්. රත්න කුමාර මහතාගේ ව්‍යාපාරික ස්ථානය මාර්ගය අවහිර වන සේ පවතින බැවින් කඩා ඉවත් කර දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නිතර දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. මෙම ව්‍යාපාරික ස්ථානය අනවසර ඉදිකිරීමක් නිසා ඉවත් කර ගන්නා ලෙස ව්‍යාපාරික මහතා හට දැනුවත් කළද ඉවත් කර නොගන්නා නිසා පොලීසියේ සහයෝගය ඇතිව කඩා ඉවත් කිරීමේ කටයුත්ත කළයුතු බවත් නඩු මගකට නොයෑමට තීරණය කර ඇති බවත් පැවසීය. අධිකරණමය ක්‍රියාමාර්ගයකට ගියහොත් දීර්ඝ කාලීනව එම නඩුව කල් යන විට එම ව්‍යාපාරික මහතාටම සභාවට ගෙවීමක් නොකර දිගුකලක් ව්‍යාපාරය පවත් වාගෙන යාමට හැකිවන බව පැවසීය.
ඒ.එම්. රත්න කුමාර මහතාගේ හා ලෙස්ලි මහතාගේ ව්‍යාපාරික ස්ථාන ඉවත් කොට පිවිසුම් මාර්ග පුළුල් කිරීමට කටයුතු කිරීමටත් ඒ.එම්. රත්න කුමාර මහතාගෙන්  හා ලෙස්ලි මහතාගෙන් සතිපොළ පවත්වනු  ලබන දින දෙකේදී සතිපොළට ඇතුළු කරනු ලබන වාහන හා භාණ්ඩ තොග සඳහා බදු අය කිරීමට කටයුතු කරන බවපැවසීය.

<u>**ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා**</u>

බිබිල සතිපොළ අලුත්වැඩියා කිරීමට දැනට සතිපොළේ වෙළඳාම් කරනු ලබන වෙළඳුන් පහත මාලය වෙත රැගෙන යාම පිළිබඳව එම වෙළඳුන් තුළ සතිපොළ වෙනත් ව්‍යාපාර කටයුත්තක් සඳහා යොදා ගනිතැයි අනිසි බියක් ඇතිවී ඇති බව පැවසූ අතර මෙම සතිපොළ තීන්ත ආලේප කර අලුත්වැඩියා කිරීමට තීරණයක් ගෙන ඇති බව ජනතා නියෝජිතයකු වන තමන් ද මේ වන තෙක් නොදැන සිටි බවත් එවැනි තීරණ පක්ෂ විපක්ෂ ජනතා නියෝජිතයින් සියළු දෙනා දැනුවත් කළයුතු බවත් පැවසීය.

මෙම වෙළඳුන් තුළ ඇති වී ඇති අනිසි බිය එම වෙළඳුන්ගෙන් තුරන් කිරීමට නම් එම වෙළඳුන්ගේ සංගමය කැඳවා දැනුවත් කළේ නම් එවැනි සැකයක් ඇති නොවන බවත් මෙවන් පෙත්සම් සඳහා සභාවෙහි කාලය වැය කිරීමට අවශ්‍ය නොවන බවත් පැවසීය.

මෙම වෙළඳ සංගමය රුස්කර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ අරමුණ ව්‍යාපාරිකයින්ට පැහැදිලි කිරීම සුදුසු බවත් පැවසූ අතර බලයට පත්වීමට පෙර ගරු සභාපතිතුමා පහත මාලයේ සතිපොළ තිබියදී ව්‍යාපාරිකයින්ගේ අපහසුකම් පිළිබඳව කණගාටුව ප්‍රකාශ කළද නැවත එම අපහසුකම් මධ්‍යයට එම ව්‍යාපාරිකයින් පත් කිරීමට කටයුතු කිරීම නිසා සතිපොළ ඔවුන්ට නොලැබේවි යැයි බියක් ඇතිවී ඇති බවත් පැවසීය.

සතිපොළ අලුත්වැඩියා කිරීම පිළිබඳව මන්ත්‍රී මණ්ඩලය මෙම පෙත්සම ලැබෙනතුරු දැනුවත්ව නොසිටි බැවින් තීරණ ගැනීමේදී ගනු ලබන තීරණ පිළිබඳව පක්ෂ විපක්ෂ ජනතා නියෝජිතයින් සියළු දෙනා දැනුවත් කරන ලෙසත් මන්ත්‍රී මණ්ඩලයේ සාමූහික වගකීම ආරක්ෂා කර දෙන ලෙසත් සතිපොළ වෙළඳුන් හට අසාධාරණයක් නොකර සාධාරණය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

මෙම පෙත්සම සතිපොළේ ව්‍යාපාරිකයින්ගෙන් 80% ක් පමණ දෙනෙකුගේ අත්සන් වලින් සමන්විතව ඉදිරිපත් කර තිබීම නිසා මෙම කාරණය සුළුවෙන් නොසලකන ලෙසත් මෙම වෙළඳුන් පහත මාලයේ වෙළඳාම් කරනු ලැබුවේ ඉතා දුෂ්කරව බවත් පැවසීය. මෙම සතිපොළ බෙදීම් කර ඇත්තේ දේශපාලන පක්ෂයකින් නොව සභා ලේකම් විසින් සභාව පාලනය කළ කාලයේ බැවින් මෙම බෙදාදීම දේශපාලන මැදිහත් වීමකින් සිදුව නැති බව පැවසීය.

මෙම ව්‍යාපාරිකයින් නව සතිපොළෙහි තමාගේ ව්‍යාපාරික පසුබිම මේ වනවිට ගොඩනගා ගෙන ඇති බවත් නැවත පහත මාලයට රැගෙන යැමෙන් ඔවුන්ගේ ව්‍යාපාරය පසුබෑමකට ලක්වන බවත් දුෂ්කරතා ඇති අපිරිසිදු පහත මාලයට සතිපොළ ස්ථාපිත කර නව සතිපොළ වෙනත් ව්‍යාපාරයකට යොදා ගනිතැයි යන අනිසි බියක් වෙළඳුන් තුළ ගොඩනැගී ඇති බවත් පැවසීය. මෙම පෙත්සම ලැබෙන තුරු තමන් මේ පිළිබඳව දැනුවත් වී නොමැති බවත් නිවැරදිව නම් මෙම අලුත්වැඩියා කිරීමට සභා තීරණයක් ගැනීම අවශ්‍ය බවත් එවන් කිසිදු තීරණයක් සභාවේදී ලබාගෙන නොමැති බැවින් මන්ත්‍රී මණ්ඩලය දැනුවත් වීම සුදුසු බවත් පැවසීය.

මෙවැනි තීරණයක් ගැනීමට පෙර මන්ත්‍රී මණ්ඩලය මෙන්ම සතිපොළ වෙළඳ සංගමය දැනුවත් කර අලුත්වැඩියා කිරීමේ අරමුණ පැහැදිලි කරදීම සුදුසු බවත් පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රී මණ්ඩලය එක්ව වෙළඳ සංගමය සමඟ සාකච්ඡාවක් කර අදහසක් ලබා ගෙන කටයුතු කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා</u>

සතිපොළ අලුත්වැඩියා කරන බව පවසා වෙළඳුන් පහත මාලයට යවා පසුව ඒ අයට සතිපොළෙහි තමාගේ ස්ථානය නොලැබී යැයි මෙන්ම මෙම ස්ථානයෙහි ගාමන්ට් ෆැක්ටරියක් ආරම්භ කරාවි යැයි සැකයක් පවතින බව පැවසීය.

මෙම අවස්ථාව වන තෙක්ම සභාව විසින් සතිපොළ අලුත්වැඩියා කිරීමට ගෙන ඇති තීරණය තමන් මන්ත්‍රීවරයෙකු ලෙස දැනුවත්ව නොසිටි බව පැවසීය. මෙය ආරම්භ කර කෙටි කාලයක් බැවින් අලුත්වැඩියා කිරීමට අවශ්‍යතාවයක් නොමැති බවත් මේ වන විට සභාව සතුව විශාල අරමුදලක් නොමැති බැවිනුත් වෙළඳුන් විසින් පවත්වාගෙන යනු ලබන අපිරිසිදු අපිළිවෙල ව්‍යාපාර ස්ථාන පිරිසිදු කර පිළිවෙලට තට්ටු සාදා සකස් කර දීමටත් ව්‍යාපාරිකයින් වැඩිපුර අත්කරගෙන ඇති භූමි ප්‍රමාණ ඇත්නම් ඒවා නිවැරදිව මැන වෙන් කර දීමටත් කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

අලුත්වැඩියා කර මෙම ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර ස්ථාන වෙනස් කර දේශපාලනමය බල හිමි ආණ්ඩු පක්ෂයේ පාක්ෂිකයින්ට ලබා දෙතැයි යන සැකයක් ද සතිපොළ ව්‍යාපාරිකයින් තුළ හටගෙන ඇති බැවින් එසේ නොකරන ලෙස ඉල්ලීමක් කළ අතර වාහන නැවතුම් පොළක් පහත මාලයෙන් ස්ථාපනය කරන ලෙසත් ඒවායින් කුලී මුදල් අයකිරීමෙන් මුදල් උත්පාදනය කරගත හැකි බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා</u>

බිබිල සතිපොළ ටෙන්ඩර් නොකර පොළ කාසි එකතු කිරීමට බිබිල ප්‍රාදේශීය සභාව භාර ගැනීමට කටයුතු කළ අවස්ථාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඊට විරුද්ධ වූ බවත් මෙසේ පෙත්සම් එවීම ,ආණ්ඩුකාරතුමා වෙත ලිපි යැවීම එහි දිගුවක් බවත් පැවසූ අතර ඒ අයගේ අදහස් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමේ වේදනාව දරා ගැනීමට බැරිව ක්‍රියාත්මක කරවන්නක් බව පැවසීය.

පොළ ටෙන්ඩර් නොකිරීමට තීරණය කළ අවස්ථාවේ මෙම පොළ නැවත බෙදීමට කටයුතු කරන බව ඒ අවස්ථාවේදී තීන්ත ආලේප කර අලුත්වැඩියා කිරීමට තීරණය ගතයුතු බවත් ගරු මූලාසනය පැවසූ බව පැවසීය.

ප්‍රජාව හා මන්ත්‍රී මණ්ඩලයද එකතුව 2026 ජනවාරි 01 වනදා සතිපොළෙහි ශ්‍රමදානයක් පැවැත්වූ බවත් එම අවස්ථාවේ ගරු සභාපතිතුමා බිල්පත් නිකුත් කිරීම සිදු කරමින් මෙම සතිපොළ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ අරමුණ ව්‍යාපාරිකයින්ට පැහැදිලි කළ බවත් එම අවස්ථාවේ දී ඒ සඳහා එම ව්‍යාපාරිකයින් එකග වූ බවත් පැවසීය.

ඒ අනුව මෙම පෙත්සම අත්සන් කිරීම සිදුකර ඇත්තේ ලිපියේ අරමුණ පැහැදිලි කරගෙනද එසේත් නැතිනම් බල කිරීමකින්ද යන්න සොයා බැලිය යුතු බවත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රී මණ්ඩලයේ මත ගැන නොසලකා මෙම සතිපොළ තීන්ත ආලේප කර අලුත්වැඩියා කිරීමට කටයුතු කරමු යැයි පැවසීය. සතිපොළ ප්‍රජාවට ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ ව්‍යාපාරිකයින්ගේ ආදායම වැඩි කිරීමට මිස සභාවට අරමුදල් තරකර ගැනීමට නොවන බවත් පැවසීය. අප්‍රේල් මාසය වනවිට මෙම ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර අවස්ථා පුළුල් කර දීමට කටයුතු කරමු යැයි පැවසීය.

ව්‍යාපාරිකයින් සමඟ සාකච්ඡාවක් කිරීමට විපක්ෂය විසින් යෝජනා කළද සභාපතිතුමා ජනවාරි 01 වනදා මෙම ව්‍යාපාරිකයින් දැනුවත් කළ ද නැවතත් ව්‍යාපාරිකයින් සමග සාකච්ඡාවක් ගනිමු යැයිද පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රීවරුන් එක්ව මෙම ව්‍යාපාරිකයින්ගේ සිතෙහි ගොඩනැගී ඇති අනිසි බිය නැතිකර ඒ අයගේ සැකය දුරුකර ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර අවස්ථා පුළුල් කළ හැකි බව සමාජගත කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා</u>

මෙම පෙත්සම තමා වෙතද ලැබී ඇති බවත් මෙම ව්‍යාපාරිකයින් පහත මාලය වෙත යවා අලුත්වැඩියා කර නැවත ඒ අයට තමා සිටි ස්ථානය නොලැබේවි යැයි සැකයක් ඇතිවී ඇති බවත් පැවසූ අතර එම ව්‍යාපාරිකයින් සමග සාකච්ඡා කර පැහැදිලි කිරීමක් කර සාධාරණයක් කරමු යැයි පැවසූ අතර ලබා

ගන්නා තීරණය පිළිබඳව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ව්‍යාපාරිකයින් සියළු මන්ත්‍රීවරුන් දෙස එකම ආකාරයකින් බලන බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

ගරු ආණ්ඩුකාරතුමා වෙත  සතිපොළ රෙදි වෙළඳුන්ගේ ආදායම අඩුබව දන්වා යවන ලද ලිපියක් හේතුවෙන් සතිපොළෙහි සංගණනයක් කිරීමට තමා සමඟ මන්ත්‍රීවරු 05 දෙනෙකු ගිය බවත් එහිදී සතිපොළෙහි සිටින අයගේ නම, ලිපිනය, පොළෙහි කෙතරම් කාලයක් සිටිනවාද, තමාට ඇතිවී ඇති බාධක පිළිබඳ තොරතුරු 121 දෙනෙකුගෙන් ලබා ගත් අතර එම අවස්ථාවේ වෙළඳුන් සමග කතා කිරීමේදී මෙම ස්ථානයේ අසභ්‍ය ලෙස කතා කරන බවත් පිටුපස සිටින වෙළඳුන් සඳහා ආදායමක් නොලැබෙන බවත් ,ව්‍යාපාරවලට පැමිණෙන පිවිසුම් වසා ව්‍යාපාරිකයන් අත්පත් කරගෙන ඇති බවත් පැවසීය.

එම නිසා මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර සැමට සාධාරණයක් වන ලෙස බෙදා වෙන් කර දෙමු යැයිද එසේම ඒ අයගේ සිතෙහි හට ගෙන ඇති අනිසි බිය මෙන්ම ගාමන්ට් ෆැක්ටරියක් ආරම්භ නොකරන බව සියළු දෙනා එක්ව ඒ අයට පැහැදිලි කර සමාජගත කරමු යැයිද එසේම ආකර්ෂණීය පොළක් නිර්මාණය කර ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර අවස්ථා පුළුල් කිරීමට සියළු දෙනා එක් වෙමු යැයිද පැවසීය.

<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය</u>

සතිපොළෙහි වෙළඳාම් කරනු ලබන්නේ  ව්‍යාපාරිකයින් තමාගේ පවුලේ අභිවෘද්ධිය සඳහා බවත් ඒ අයට එම කටයුත්තේදී විවිධ ගැටලු වලට මුහුණදීමට සිදුවන බවත් පැවසීය. පොළට යන සෑම විටම තමා සමගද විවිධ මැසිවිලි නැගුවද සභා ලේකම්තුමිය ඔවුන් හට සාධාරණයක් ඉටු කරමින් සහයෝගය ලබා දුන් බව පැවසූ බවත්  මෙම ව්‍යාපාරිකයින්ගේ තට්ටු සකස් කිරීමට විශාල වියදමක් දරා ඇති බවත් වෙළඳුන් පහත මාලයට යැවුවහොත් නැවත ඒවා සකස් කර ගැනිමට පිරිවැයක් දැරීමට සිදුවන බවත් පැවසූ අතර සියළු දෙනා හට සාධාරණයක් ඉටු කරන ලෙසත් වෙළඳ සංගමය සමග සාකච්ඡා කර සාධාරණ තීරණයක් ලබා ගන්නා ලෙසද ඉල්ලා සිටින ලදි.

<u>ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා</u>

මෙම සතිපොළ පහත මාලයට ගෙන ගොස් සතිපොළ අලුත්වැඩියා කරන බව හා මෙහි ගාමන්ට් ෆැක්ටරියක් විවෘත කිරීමට යන බවක් කට කතා මගින් තමා දැනුවත් වූ බවත් බිබිල නගරයේ කිසිදු කාර්යක් මෙම කාලසීමාව තුළ ක්‍රියාත්මක නොකර සතිපොළ විවෘත කර අවුරුද්දක් වැනි පොඩි කාලසීමාවකදී සති පොළ අලුත්වැඩියා කරන්නේ කුමකටදැයි විමසීය.

සතිපොළ ටෙන්ඩර් කිරීමේදී විපක්ෂය විරෝධතාවය දැක්වුවද මෙම වෙළඳුන් පොළඹවා සතිපොළ සම්බන්ධයෙන් විරෝධතා ගොඩනගන බව ගරු මන්ත්‍රි ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා පැවසුවද කිසි විටෙක විපක්ෂය විසින් සතිපොළ වෙළඳුන් පෙළඹවීමට කටයුතු නොකළ බවත් සතිපොළ ටෙන්ඩර් නොකිරීමට විරුද්ධ වූයේ සභාවට ලක්ෂ 28 කට වැඩි මුදලක් උත්පාදනය කර ගැනීමට නොහැකි   වුවහොත් සභාවට ආදායම අහිමි වන බැවිනුත් මන්ත්‍රී මණ්ඩලය  සඳහා අධිභාර ඇතිවේ යැයි යන සැකය නිසාබවත් පැවසීය. ගරු මන්ත්‍රි ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා සතිපොළ ආදායම වැඩිවී ඇති බව පවසූ අතර ඒ පිළිබඳව තමා සතුටු වන බවත්  සතිපොළ වෙළඳුන් 121 දෙනෙකුගෙන් 90 දෙනෙකු පෙත්සම සඳහා අත්සන් කර ඇති බැවින් සතිපොළ ව්‍යාපාරිකයින්ගෙන් විශාල ප්‍රමාණයක් ඊට විරුද්ධ වී ඇති බව පැවසීය. මෙම ව්‍යාපාරිකයින් සමග සාකච්ඡාවක් කිරීමේදී විපක්ෂ මන්ත්‍රීවරුද දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

බිබිල සතිපොළ අක්‍රමවත් කර ඇත්තේ එකල සේවයේ නියුතු බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරී බවත් පිවිසුම් මාර්ගය අඩි 4ක්වත් පළලක් දැනට නැති බවත් නැවත බෙදීමේදී අඩි 08කවත් පළලක් ලබාදියයුතු බවත් ව්‍යාපාරික ස්ථාන 05කින් 05කට අතරින් මාර්ගයක් තැබියයුතු බවත් පඩිපෙලවල් තුනකින් ඇති පිවිසුම් මාර්ග වසා නොතබා පිවිසීමට අවස්ථාව ලබාදියයුතු බවත් පෙන්වා දෙන ලදි. මෙම ස්ථානයෙහි ගාමන්ට් ෆැක්ටරියක් ආරම්භ කිරීමට යන බවක් තමාටද ආරංචි වූ බවත් එය එසේ සිදු නොවන බවට තමා එම ප්‍රජාව දැනුවත් කළ බවත් පැවසූ අතර සතිපොළ තීන්ත ආලේප කර අලුත්වැඩියා නොකර ව්‍යාපාරිකයින්ට අසාධාරණයක් නොවන ආකාරයට බෙදා වෙන් කර දීම සුදුසු බව පැවසීය.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**</u>

මෙම අලුත්වැඩියා කිරීම පිළිබඳව සතිපොළේ ව්‍යාපාරිකයින් සමග සාකච්ඡා කළ බවත් ඒ අයට තම ව්‍යාපාරික ස්ථානය නොලැබේවි යැයි අනියත බියකින් කටයුතු කරන බව හඳුනා ගත් බවත් පැවසීය. සතිපොළ බෙදීම් සිදුකළ කාර්මික නිළධාරී මහතාට ඒ ඒ ක්ෂේත්‍ර වෙන් වෙන්ව බෙදා දීමට කටයුතු කරන ලෙස එකල තමන් දැනුවත් කළද එම කාර්මික නිළධාරිවරයාගේ අභිමතය පරිදි බෙදා වෙන් කිරීම නිසා සතිපොළ මෙලෙස ව්‍යාකූල වී ඇති බවත් පැවසීය.

සතිපොළේ ව්‍යාපාරිකයින්ගේ විශාල ප්‍රමාණයක් සමග සාකච්ඡා කළද සෙනසුරාදා හා බදාදා දිනයන් වල පමණක් පැමිණෙන ව්‍යාපාරිකයින් සමඟ සාකච්ඡා කිරීමට නොහැකි වූ බව පැවසූ අතර මෙම ව්‍යාපාරිකයින් පවසා සිටියේ පාරිභෝගිකයින් පිටුපසට පිවිසීම අඩු බවයි.මෙම ගැටලු නිරාකරණය කිරීමට නම් අනිවාර්යයෙන්ම සතිපොළ බෙදීමට ලක්කළ යුතු බවත් එසේ කිරීමට නම් මෙම ව්‍යාපාරිකයින් පහත මාලය වෙත රැගෙන යායුතුම බවයි. වැසි සමයේදී පහත මාලයේ ජලය පිරී අපවිත්‍ර වී පවතින බවත් එවන් වැසි සමයක මෙම වෙළඳුන් එම ස්ථානයට නොයවන බවත් ,පහත මාලය පිරිසිදු කර වැසි සමය නොමැති කාලයක දී රැගෙන යාමට තීරණය කර ඇති බවත් මේ පිළිබඳව ව්‍යාපාරිකයින් සමග ද සාකච්ඡා කර ඇති බවත් පැවසීය.

සතිපොළ අලුත්වැඩියා කිරීමේ අදහස සතිපොළ ව්‍යාපාරිකයින්ටත් මන්ත්‍රී මණ්ඩලයටත් ඉදිරිපත් කර අදහස් රැස්කිරීමක් සිදුකලා මිස අලුත්වැඩියා කිරීමට තීරණයක් ගෙන නොමැති බවත් මෙම අදහස් එකතු කරන ප්‍රවිශ්ඨයක් බවත් එය සංවාද මට්ටමේ පවතින බවත් පැවසීය. එය අලුත්වැඩියා කිරීමට නම් සභාවට යෝජනාවක් ඉදිරිපත් කර තීරණයක් ලබා ගෙන , අලුතින් විවෘත කළ ගොඩනැගිල්ලක් බැවින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියද ලබා ගතයුතු බවත් ,එම අනුමැතිය ලබාගෙන පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ කාර්මික නිළධාරිගේ නිර්දේශයද ලබා ගතයුතු අතර මෙය දිගුකාලීන ක්‍රියාදාමයක් බව පැවසීය.

ව්‍යාපාරිකයින් බහුතරයක්ම ඔවුන්ගේ තට්ටු ස්ථිරව පිළිවෙලට සකස් කර නොගෙන ඇති බවත් තමන්ට අවශ්‍ය පරිදි අවශ්‍ය ප්‍රමාණයට බිම් කොටස් අත්පත් කරගෙන ව්‍යාපාරික ස්ථානය සකස් කරගෙන ඇති බවත් සතිපොළක ආකර්ෂණීයභාවය ඇති කර ගැනීමට නම් ව්‍යාපාර ඒකාකාරී වියයුතු බවත් ඒ ආකාරයට කටයුතු සකස් කිරීම සඳහා සියළු ව්‍යාපාරිකයින් මෙම ස්ථානයෙන් ඉවත් කළ යුතුම බවත් පැවසීය.

මෙම පෙත්සම අත්සන් කරන ලද සියළුම ව්‍යාපාරිකයින් තනි තනිව කැඳවා අත්සන් කළේ කුමන පදනමකින්ද යන්න විමසියයුතු බවත් ඒ සඳහා ප්‍රාදේශීය සභාවට නොගෙන්වා ඒ අයගේ ව්‍යාපාර කටයුතු කරන අතරතුරම සතිපොළෙහි පිටුපස ඉඩ ඇති ස්ථානයට ගෙන්වා සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළයුතු බවත් එමගින් යම්කිසි නිගමනයකට එළඹීමට හැකි බවත් පැවසීය.

බිබිල සතිපොළේ ව්‍යාපාරිකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් තම තට්ටුව අපිරිසිදුව පවත්වාගෙන යන බවත් බීමතින් හැසිරෙන ව්‍යාපාරිකයින් සිටින බවත් පැවසූ අතර එම තත්වයන් වෙනස් කර සතිපොළ විධිමත්ව විනයානුකූලව පවත්වාගෙන යායුතු බවත් පැවසීය.

දඹුල්ල සතිපොළ පිළිවෙලට විධිමත්ව පවත්වාගෙන යන බවත් මීට අවුරුදු ගණනාවකට ඉහතදී බිබිල සතිපොළද විධිමත්ව පැවතුන අතර නූතනයේ එය අවිධිමත් භාවයට පත්ව ඇති බැවින් විධිමත් කර ගැනීම සඳහා සභාව ලෙස මැදිහත් වීමක් අවශ්‍ය බවත් එසේ මැදිහත් වී අතීතයේ සේ ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීමට විනයානුකූල පොළක් නිර්මාණය කරමු යැයි පැවසීය.

2026 වර්ෂය අවසානයේ දී රු.5,000,000.00 ක ආදායමක් උත්පාදනය කළහැකි බවත් මෙය සභාවට ලැබෙන ශුද්ධ ආදායම නොවන බවත් විදුලි බල්පත් හා සේවක වැටුප් ගෙවීමට මෙම මුදලින් වැයවන බව පැවසීය.

දැනට සතිපොළෙහි බිල් නිකුත් කිරීම සඳහා සභාවේ සේවක මහතෙකු හා දෛනික වැටුප සේවක මහතුන් දෙදෙනෙකු බඳවා ගෙන ඇති බවත් ඉදිරියේදී මෙම සේවක මහතුන් දෙදෙනා සභාවට බඳවා ගැනීමට බලාපොරොත්තු වන බවත් පැවසීය. ප්‍රාදේශීය සභාවේ මුරකරුවෙකු යෙදීම මගින් රාත්‍රී කාලයේදී ව්‍යාපාරිකයින්ගේ භාණ්ඩ වලට ආරක්ෂිතභාවය ඇති කිරීමටත් විදුලි බිල්පත් අඩු කර ගැනීමටත් බලාපොරොත්තු වන බව පැවසීය.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ප.ව.12.25 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු මූලාසනයේ යෝජනා.

### 05.01.01. බිබිල පොදු වෙළඳපොළ කඩ කාමර බිබිල ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සම්බන්ධවයි.

1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනිමේ)පනත ප්‍රකාරව කඩ කාමර පවරා ගැනිමේ නියම බලධරයා ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා නම් කර ඇත.

ඒ අනුව උක්ත කරුණට අදාලව මගේ සාමාංක හා 2025.12.09 දිනැතිව පළාත් පාලන කොමසාරිස් ඇමතූ ලිපිය මඟින් බිබිල ප්‍රාදේශිය සභාවට අයත් බිබිල නගරයේ පිහිටා ඇති බිබිල පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩ කාමර අංක A 02, A 04, A 05, B 02, B 03, B 05 කඩ 2025.04.04 දින සිට මාසික කුලි නොගෙවීම නිසා ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව ගිවිසුම අවලංගු කර ඇති බවත් එම කඩ කාමර සභාවට භාර දෙන ලෙස බඳුකරුවන් දැනුවත් කලත් මේ වන තෙක්ම කඩ කාමර සභාවට භාර දීමට කටයුතු කර නොමැති බවත් එම නිසා කඩ කාමර පවරා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලුම් කර ඇත.

එකී ලිපියට පිළිතුරු වශයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/4/2/5 හා 2025.12.19 දිනැති ලිපිය මඟින් රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනිමේ) පනත ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා විධිමත් සභා තීරණය යොමු කරන ලෙස දන්වා ඇත

එ බැවින් 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනිමේ)පනත ප්‍රකාරව මෙම බලය පළාත් පාලන කොමසාරිස් වෙත පැවරි ඇති බැවින් එම පනත යටතේ මෙම කඩ කාමර බිබිල ප්‍රාදේශිය සභාවට පවරා ගෙන ටෙන්ඩර් කිරීමට හා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කිරීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපල සංකීර්ණයේ කඩකාමර වන අංක A 02, A 04, A 05, B 02, B 03, B 05 කඩ පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන ටෙන්ඩර් කිරීමට විධිමත් සභා තීරණයක් ඉල්ලුම් කර තිබියදී උක්ත කඩ හිමියන් ගරු ආණ්ඩුකාරතුමන් හා පළාත් පාලන කොමසාරිස්තුමා හමුවීමට ගොස් ඇති බවත් එහිදී එම කඩ කාමර කඩ හිමි බඳුකරුවන් හටම ලබාදීමටත් ,හිඟ බඳු මුදල් අය කිරීමටත්, නව ගිවිසුමකට එළඹීමටත්, නව තක්සේරුවකට ගොස් එම තක්සේරුව අනුව බඳු දීමටත් ගරු ආණ්ඩුකාරතුමා එකඟතාවය පල කර ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීමට සිදුවන බැවින් මෙම යෝජනාව ඉදිරි සභාවකට කල් තැබීමට සිදුවන බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳපල සංකීර්ණයේ අංක A 02, A 04, A 05, B 02, B 03, B 05 කඩ කාමර, ගිවිසුම් අවලංගු කරන ලද කඩ හිමියන්ටම ලබාදීමට අදාළව ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය සහිතව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවීමට නියමිත ලිපිය ලැබුණු පසු **ඉදිරි සභාවකට ඉදිරිපත් කිරීමට කල් තබන ලදී.**

## <u>05.01.02. බිබිල ප්‍රාදේශීය සභාවේ කඩ කාමර පැවරිමේ දි අය කරනු ලබන පැවරුම් ගාස්තු අය කිරිම පිළිබඳවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025.11.14 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.02 තීරණය අනුව දොඩම්ගොල්ල අංක 02 කඩ කාමරය පැවරීමේ ගාස්තු වශයෙන් රු:10000.00ක මුදලක් අය කිරිමට තීරණය කර ඇත.

2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 කඩ කාමර පැවරිම සම්බන්ධයෙන් පහත පරිදි සඳහන් වේ.

“36 වැනි වගන්තියේ සිට 39 වැනි වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල කුමක් සඳහන්ව තිබුණද ප්‍රාදේශීය සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කලත්‍රයාට හෝ දරුවෙකුට කඩ කාමරය පවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල බාධාවක් නොවිය යුතුය. එසේ දෙන ලද තැනැත්තා සමඟ නව බදු ගිවිසුමකට එළඹිය යුතුයි.”

ඒ අනුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ වගන්ති ප්‍රකාරව බිබිල ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් කඩ කාමර පැවරිමේදි අය කල යුතු පැවරුම් ගාස්තු තීරණය කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

- පොදු වෙළඳපොල A ශ්‍රේණියේ කඩ කාමර
- පොදු වෙළඳපොල B ශ්‍රේණියේ කඩ කාමර
- පොදු වෙළඳපොල C ශ්‍රේණියේ කඩ කාමර
- බිබිල බස්නැවතුම්පොළ නව වෙළඳ සංකීර්ණය කඩ කාමර
- බහුකාර්ය ගොඩනැගිල්ල කඩ කාමර
- බිබිල නව සතිපොල ගොඩනැගිල්ල කඩ කාමර
- දොඩම්ගොල්ල කඩ කාමර (2025.11.14 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.02 තීරණය අනුව දොඩම්ගොල්ල අංක 02 කඩ කාමරය පැවරීමේ ගාස්තු වශයෙන් රු:10000.00ක මුදලක් අය කර ඇත.)

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

මෙම කඩ කාමරවල පැවරුම් ගාස්තු තීරණය කිරීම සඳහා එම එක් එක් කඩ කාමරවල තක්සේරු වටිනාකම් සහිතව **ඊළඟ මහ සභාවට ඉදිරිපත් කිරීමට කල්තබන** ලදී.

## 05.01.03. බිබිල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ C- 08 කාමරය පැවරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ C- 08 කඩ කාමරය බිබිල,යල්කුඹුර,බදුල්ල පාර,රජිත නිවස ලිපිනයෙහි පදිංචි එච්.එම්.කරුණාරත්න යන අය විසින් බදු ලබාගෙන ඇත. මෙම කඩ කාමරය බිබිල,කොටගම,මුදියල ,268/A ලිපිනයෙහි පදිංචි එච්.එම්.වජිරා මධුභාෂිණී වන වැඩිමහල් දියණියට පවරා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත.

2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 පහත පරිදි සඳහන්වේ.

“36 වැනි වගන්තියේ සිට 39 වැනි වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල කුමක් සඳහන්ව තිබුණද ප්‍රාදේශීය සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කාලත්‍රයාට හෝ දරුවෙකුට කඩ කාමරය පවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල බාධාවක් නොවිය යුතුය. එසේ දෙන ලද තැනැත්තා සමඟ නව බදු ගිවිසුමකට එළඹිය යුතුයි.”

ඒ අනුව 2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 ප්‍රකාරව අවශ්‍ය කටයුතු කිරීම සඳහා මෙම කඩ කාමරය පැවරීම සඳහා ඉල්ලීම් ලිපි සහ දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ C- 08 කඩ කාමරය බිබිල ,යල්කුඹුර,බදුල්ල පාර,රජිත නිවස ලිපිනයෙහි පදිංචි එච්.එම්.කරුණාරත්න යන අය විසින් බඳු ලබා ගෙන ඇති අතර එය ඔහුගේ වැඩිමහල් දියණිය වන බිබිල,කොටගම,මුදියල ,268/A ලිපිනයෙහි පදිංචි එච්.එම්.වජිරා මධුභාෂිණි යන අයට පවරා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2025.12.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවේ ජල ගබඩාව සඳහා පී.වී.සී.ගම් 10 Kg ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

2. බිබිල රදළියද්ද ආදාහනාගාරය සඳහා ගෑස් මිලදී ගැනීම සඳහා ක්ෂණිකව ලබාගැනීමේ පහසුව පිළිබඳ සැලකිල්ලට ගෙන අප දැනට මිලදී ගනු ලබන ලාෆ් සමාගමේ ඒ.ආර්.අබේසිංහ ඩිස්ට්‍රිබියුටර් ආයතනයේ නියෝජිත ආයතනයේ ශාඛාවක් වන බිබිල,ප්‍රාදේශීය සභාව ඉදිරිපිට, දර්ශන හාඩ්වෙයාර් ආයතනයෙන් ගෑස් ලබාගත් මිලටම ගෑස් මිලදී ගැනීම.

3. 2026 වර්ෂය සඳහා කාර්යාලයට අවශ්‍ය පහත සඳහන් ලිපිද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | A4 (80gsm) පැකට් | 150 |
| 02 | A4 වර්ණ පැකට් | 05 |
| 03 | නිල් පෑන් | 300 |
| 04 | අත්සන් පෑන් | 10 |
| 05 | මාකර් පෑන් | 10 |
| 06 | හාෆ්ෂීට් පැකට් | 01 |
| 07 | ලිපිගොණු කවර | 200 |
| 08 | ෆයිල් ලේස් පැකට් | 20 |
| 09 | මැගසින් ෆයිල් | 20 |
| 10 | 6X3 ලියුම් කවර | 200 |

| | | |
|---|---|---|
| 11 | 9X4 ලියුම් කවර | 2000 |
| 12 | පොඩි බැටරි | 20 |
| 13 | මධ්‍යම බැටරි | 20 |
| 14 | ස්ටික් නෝට් (පොඩි) පැකට් | 05 |
| 15 | ඇමණුම් කටු (ලොකු පැකට්) | 10 |
| 16 | ස්ටෙප්ලර් කටු (ලොකු පැකට්) | 20 |
| 17 | තීන්ත පෑඩ් | 05 |
| 18 | ටිපෙක්ස් කුඩා ප්‍රමාණයේ බෝතල් | 20 |
| 19 | බයින්ඩර් ගම් බෝතල් 50 ml | 10 |
| 20 | කාබන් කොළ තනිපිට 100 බන්ඩල් | 02 |
| 21 | කාබන් කොළ දෙපිට 100 බන්ඩල් | 01 |
| 22 | බයින්ඩින් ටේප් රෝල් 2'' | 50 |
| 23 | සෙලෝටේප් අගල් 1 සුදු යාර 30 රෝල් | 20 |
| 24 | සෙලෝටේප් අගල් 2 දුඹුරු යාර 30 රෝල් | 20 |
| 25 | වයිට් බෝඩ් ඩස්ටර් | 05 |
| 26 | විශබීජනාශක සබන් 100 g කැට | 600 |
| 27 | ඉදල් | 50 |
| 28 | අත්වැසුම් ජෝඩු | 50 |
| 29 | හාපික් 500 ml බෝතල් | 20 |
| 30 | ටයිල් ක්ලීනර් 500 ml බෝතල් | 05 |
| 31 | ටෝනර් 2323 පුස්තකාලය | 02 |
| 32 | ටෝනර් 2161 කාර්යාලය | 05 |
| 33 | ටෝනර් 2518 කාර්යාලය | 05 |
| 34 | LQ රිබන් 310 | 20 |
| 35 | මුද්‍රණ කඩදාසි 15X11X1 PLY බන්ඩල් | 03 |
| 36 | ප්‍රින්ට් පේපර් පෙරටු කාර්යාලය 2/4 2 PLY බන්ඩල් | 08 |
| 37 | මාස්ක් | 100 |
| 38 | පොලිතින් | 2Kg |
| 39 | පොඩි කතුරු | 20 |
| 40 | බිස්ටල් බෝඩ් | 20 |
| 41 | පේපර් කටර් | 05 |
| 42 | කොසු | 20 |
| 43 | මොබ් | 05 |
| 44 | ටෝනර් 2507 | 05 |
| 45 | ඩබල් ටේප් අගල් ½ යාර 30 | 10 |
| 46 | ඩබල්ටේප් අගල් 01 යාර 30 | 10 |
| 47 | බ්‍රවුන් පේපර් කොළ | 10 |

4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ අවසන් වෙමින් පවතින බැවින් පහත සඳහන් ඖෂධ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | සීතෝදක තෙලය | 750 ml |
| 02 | නිලයාදී තෙලය | 750 ml |
| 03 | සර්වවිෂාදි තෙලය | 750 ml |

| | | |
|---|---|---|
| 04 | සර්ෂපාදී තෛලය | 750 ml |
| 05 | පාඨා තෛලය | 750 ml |
| 06 | මාංජනේ සෘත් චූර්ණය | 500ml |
| 07 | අශ්වගන්ධා චූර්ණය | 500ml |
| 08 | අවිපත්තිකර චූර්ණය | 500ml |
| 09 | සුකුමාර චූර්ණය | 500ml |
| 10 | සුදර්ශනචූර්ණය | 500ml |
| 11 | හිඤ්කර ලවන චූර්ණය | 500ml |
| 12 | ගෝක්ෂුරාදී ගුග්ගුලු | පෙති 500 |
| 13 | යෝගරාජ ගුග්ගුලු | පෙති 500 |
| 14 | චන්ද්‍රප්‍රභාවටී | පෙති 500 |
| 15 | කෛෂෝර ගුග්ගුලු | පෙති 500 |
| 16 | මේදහරණී | පෙති 500 |
| 17 | සර්පගන්ධ | පෙති 500 |
| 18 | සීතාරාම වටී | ගුලි 2000 |
| 19 | නවරත්න කල්කය | 250g |
| 20 | රෝහනේකාෂ් ලේපය | 250g |

5. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA 5419 මෝටර් ග්‍රේඩර් රථය අළුත්වැඩියා කිරීම සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය විසින් නිර්දේශ කරන ලද CABIN REAR GLASS එකක් රක්ෂණ ආයතනය මගින් ප්‍රතිපූර්ණය කරන බැවින් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

6. 2026 වර්ෂය සඳහා නිකුත් කිරීමට පොදු ගබඩාව සඳහා අවශ්‍ය පහත සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සඳහා නිකුත් කරන උපකරණ ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | වල් කපන මැෂින් තල | 10 |
| 02 | වල් කපන මැෂින් ප්ලග් | 10 |
| 03 | ගම්බූට්ස් | 10 |
| 04 | සෞඛ්‍යාරක්ෂිත කණ්ණාඩි | 10 |

7. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පුවක්පැලේ කසළ අංගනය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

8. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් නායකඳුර හා රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමවලට අදාළව 2026 වර්ෂයේ සිට ජල බිල්පත් නිකුත් කිරීමට නව CAT 2020 AUTOMATION පද්ධතියට ඇතුළත් වීම සඳහා ANDRIOD POS TERMINAL මැෂින් 02 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

9. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රදලියද්ද ආදාහනාගාරය සඳහා දැනට ලාෆ් සමාගමේ ගෑස් සිලින්ඩර් 06 ක් පවතින බැවින් තවත් ගෑස් සහිත 37.5 Kg ගෑස් සිලින්ඩර් 04 ක් ලිට්රෝ සමාගමේ නියෝජිතයන්ගෙන් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05. බිබිල ප්‍රාදේශිය සභාවට අයත් නව සතිපොල ගොඩනැගිල්ලේ සතිපොල F 02 හා F04 කඩ කාමර වසර 30 කාලයකට බදු ලබා දිම සඳහා අනුමැතිය ලබා ගැනිම සම්බන්ධවයි

උක්ත කරුණට අදාළව මගේ සමාංක හා 2025.11.14 දිනැතිව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 19 (XII) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගැනිමට ඉදිරිපත් කරන ලදි .

ඒ අනුව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ලිපි ලේඛන වලට අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ 2025.05.20 දින MO/RP/807 අනුව වසර 30 ක කාලයක් සඳහා බදු ලබා දීමට 2025.08.19 දින බිබිල ප්‍රාදේශිය සභාවේ අංක 05.01.09 තීරණය ඉදිරිපත් කළ අතර එම සභා තීරණය නිවැරදි නොවන බැවින් (සභා තීරණය හා තක්සේරු වාර්තාව අතර පරස්පරතාවයක් ඇති බව) ඉදිරි කටයුතු සිදු කිරිමට නොහැකි බව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දුරකථනයෙන් දැනුම් දී ඇත.

බිබිල සතිපොළ අසල පිහිටි F02 ,F04 යටි මහලේ කඩකාමර 2ක් සඳහා රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කර වසර 30ක කාලයකට බදු දීමට ආපසු නොගෙවන කීමනි මුදල රු.1,000,000.00 ලෙස දක්වා ඇත. මාසික කුලිය රු.1700.00කි . ඒ අනුව අවම ලංසු මුදල රු.1,000,000.00ක් ලෙස දක්වා ඌව පළාත තුළ මෙම කඩකාමර ටෙන්ඩර් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල සතිපොළ අසල පිහිටි F02 ,F04 යටි මහලේ කඩකාමර 2ක් සඳහා රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කර වසර 30ක කාලයකට බදු දීමටත් ආපසු නොගෙවන කීමනි මුදල රු.1,000,000.00 ලෙස දක්වා ඇත. මාසික කුලිය රු.1700.00කි . ඒ අනුව අවම ලංසු මුදල රු.1,000,000.00ක් ලෙස දක්වා ඌව පළාත තුළ, ගරු ආණ්ඩුකාරවර අනුමැතියට යටත්ව මෙම කඩකාමර ටෙන්ඩර් කිරීම සුදුසු බවත් වාර්ෂිකව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරන ලද මාසික කුලිය අය කිරීම සුදුසු බව ටත් තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06. එළවළු වෙළඳපොල සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශිය සභාව සතුවසතු එළවළු කඩ කාමර 18 පවතින භූමියෙහි රථ වාහන නැවතුම් මධ්‍යස්ථානයක් සකස් කිරිමට යෝජිත බැවින් එම කඩ කාමර ඉදිරියේදි ඉවත් කරන බව වාචිකව දන්වා ඇත.

බිබිල එළවළු වෙළඳපොල කඩ කාමර 18 පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

| අනු අංකය | වෙළඳ සංකීර්ණය පිහිටි ස්ථානය | කඩ කාමර අංකය | බදුකරුගේ නම | ගිවිසුම් ගත දිනය | ගිවිසුම් ගත කාල පරිච්ඡේදය | **2025** වර්ෂයට අදාළව අය කර ගත යුතු හිඟ මුදල් |
|---|---|---|---|---|---|---|
| 1 | එළවළු වෙළඳපොළ | 1 | එම්.ටී.ජගත් ජයන්ත මයා | 2012.04.01 | 2012.04.01 | 12264.00 |
| 2 | | 2 | ඩී.එම්.ආනන්ද මයා | 2021.03.05 | 2021.03.05 | 2200.00 |
| 3 | | 3 | එච්.එම්.සුමනාවති මිය | 2022.11.01 | 2022.11.01-2025.10.31 | 2200.00 |
| 4 | | 4 | ආර්.එම්.ශ්‍රියාලතා රාජපක්ෂ මයා | 2012.02.02 | 2012.02.02 | 2400.00 |
| 5 | | 5 | බී.එම්.ප්‍රේමාවති මිය | 2012.02.01 | 2012.02.01 | 12264.00 |
| 6 | | 6 | ජේ.එම්.රෝහිත කුසුම්සිරි මයා | 2012.02.01 | 2012.02.01 | 6264.00 |
| 7 | | 7 | ඩබ්.එම්.රේණුකා මිය | 2012.04.25 | 2012.04.25 | 0.00 |
| 8 | | 8 | එස්.එම්.ප්‍රියන්ත සිරිකුමාර මයා | 2012.03.15 | 2012.03.15 | 0.00 |
| 9 | | 9 | ජේ.ඩබ්.වීරසූරිය බණ්ඩා මයා | 2012.03.22 | 2012.03.22 | 0.00 |
| 10 | | 10 | එම්.ටී.ප්‍රේමදාස මයා | 2012.04.19 | 2012.04.19 | 21684.00 |
| 11 | | 11 | එච්.එම්.ජයලතා මිය | 2012.07.31 | 2012.07.31 | 2200.00 |
| 12 | | 12 | ඩී.ආර්.විපුල්සිරි මයා | 2022.07.01 | 2022.07.01-2025.07.01 | 556.00 |
| 13 | | 13 | කේ.ඩී.වසන්ත කුමාර මයා | 2022.07.01 | 2022.07.01-2025.07.01 | 556.00 |
| 14 | | 14 | ජේ.එම්.රෝහිත කුසුම්සිරි මයා | 2016.01.06 | 2016.01.06 | 12264.00 |
| 15 | | 15 | එම්.එම්.පී.කේ.තිලකරත්න මයා | 2012.05.16 | 2012.05.16 | 10800.00 |
| 16 | | 16 | ඩී.එම්.කල්පනි අනුරාධා මිය | 2023.03.17 | 2023.03.17-2026.03.16 | 0.00 |
| 17 | | 17 | ජේ.එම්.ඇග්නස් පෙරේරා මිය | 2014.12.28 | 2014.12.28 | 0.00 |
| 18 | | 18 | ටී.ඩබ්.එම්.ජීවන් තුසිත මයා | 2023.08.01 | 2023.08.01-2026.07.31 | 9236.00 |
| එකතුව | | | | | | **94888.00** |

- ඒ අනුව කඩ කාමර අංක 03,12 හා 13 කඩ කාමරවල ගිවිසුම් කාලය 2025 වර්ෂයේ අවසන් වී ඇත. අංක 16 හා 18 කඩ කාමරවල ගිවිසුම් කාලය 2026 වර්ෂයේ අවසන් විමට ඇති අතර ඉතිරි කඩ කාමර 13 සඳහා ගිවිසුම් කාලය නිමා වීම පිළිබඳ දින වකවානු රහිතව අත්සන් කර ඇත.

- 2025 වර්ෂයට අදාළව කඩ කාමර 18 න් අයවිය යුතු හිඟ මුදල රු:94888.00 කි. එම හිඟ මුදල් ගෙවීම් කරන ලෙස බදු කරුවන් ලිඛිතව දැනුවත් කර ඇත.

ඒ අනුව එළවළු කඩ කාමර 18 රථ වාහන මධ්‍යස්ථානය ඉදි කිරිමේ සංවර්ධන කටයුතු සඳහා ඉවත් කරන්නේ නම් 2026 වර්ෂයේ ජනවාරි මස සිට එම කඩ කාමර බිල් කිරිම ගැටලු සහගත බැවින් ඒ පිළිබඳව හා කඩ කාමර ඉවත් කිරිමේ දි බදුකරුවන් හට දැනුවත් කිරිම් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>
2026 ජනවාරි 29 වන දින වනවිට මෙම කඩ, කඩා ඉවත් කර ගන්නා ලෙස කඩ හිමියන් වෙත දන්වා යවා ඇති බවත් එම කඩ හිමියන් ගෙන්වා සාකච්ඡාවක්ද සිදුකළ බවත් පැවසීය.

මෙම කඩ හිමියන් ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතෙන් බලය පවතිව බැවිනුත්, එම කඩවලින් කිහිපයක ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවිනුත්, සමහර කඩවල ගිවිසුම් කාලය නිමාවීම පිළිබඳ දින රහිත බැවිනුත්,ගෙවීමට හිඟ මුදල් පවතින බැවිනුත් , සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය පවතින බැවිනුත් , නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලැස්මට අනුව කටයුතු කිරීමට අවශ්‍ය බැවිනුත් මෙම කඩ කාමර ඉවත් කර මෙම ස්ථානයෙහි රථවාහන නැවතුම් පොළක් ඉදිකළයුතු බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය සභා පනතේ 58(1) හා 59(1) වගන්ති ප්‍රකාරව මෙම කඩ ඉවත් කිරීමට ප්‍රාදේශීය සභාවට බලයක් ඇති බැවින් මෙම එළවළු කඩකාමර 18 ඉවත් කර රථවාහන නැවතුම් පොළක් ඉදිකිරීමට හා 2026 ජනවාරි මස සිට එම කඩ කාමර වල බිල් කිරීම නතර කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.07. බිබිල සංස්කෘතික මධ්‍යස්ථාන භූමියේ ඇති සතොස පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ මාසික කුලිය තක්සේරු කිරීම</u>

බිබිල ප්‍රාදේශිය සභාව සතු සතොස ගොඩනැගිල්ල සඳහා අය කළ යුතු මාසික කුලී මුදල රු.194,000.00 ක් ලෙස අංක Mo/RP/581 හා 2025.12.31 දිනැතිව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරු වාර්තාව ලැබී ඇත.

සතොස ගොඩනැගිල්ල සඳහා අත්සන් කළ බදු ගිවිසුම 2025.12.31 දිනෙන් අවසන් වී ඇති අතර 2026.01.01 දින සිට නව බදු ගිවිසුම් අත්සන් කර 2026 ජනවාරි මස සිට ඉදිරි වසර දෙකක කාලයක් සඳහා මාසික කුලිය ලෙස රු:194000.00 ක මුදලක් අය කිරිමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08. 2026 වර්ෂයේ තක්සේරු වාර්තා (K පෝරම) බෙදීම වෙනුවෙන් දීමනාවක් ඉල්ලුම් කිරීම.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ මාර්ග කම්කරු සේවයේ නියුක්තව සිට දැනට විශ්‍රාම ලබා සිටින එම්.අබේරත්න බණ්ඩා මහතා 2025 වර්ෂයේ ස්වේච්ඡාවෙන් වරිපනම් තක්සේරු වාර්තා බෙදා ඇති අතර 2026 වර්ෂයේ දී මඩකලපුව ප්‍රධාන මාර්ගය හා එම මාර්ගයේ පටුමාවත් වලද තක්සේරු වාර්තා බෙදීමේ කටයුත්තෙහි යෙදී ඇති බවත් එම නිසා දීමනාවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

සුළු සේවක කම්කරු (PL 03 බණ්ඩය) ආරම්භක වැටුප වන රු.40,000.00 වැටුපෙන් 30න් 1ක්, දිනක වැටුප ලෙස රු.1333.00ක මුදලක් 2026 ජනවාරි මාසය සඳහා පමණක් K පෝරම බෙදීම වෙනුවෙන් එම්.අබේරත්න මහතා හට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ගෙවීම් කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.09. දෛනික පදනම මත සේවකයින් 12 දෙනෙකු බඳවා ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කැළි කසළ එකතු කිරීමේ කටයුතු සඳහා දැනට සේවයේ නියුතු සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින් අලුතින් සෞඛ්‍ය කම්කරුවන් 7 දෙනෙකු සහ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා ක්ෂේත්‍ර කම්කරුවන් 05 දෙනෙකු බඳවා ගැනීමේ අවශ්‍යතාවයක් පවතින බැවින් දෛනික පදනම මත සේවකයින් 12 දෙනෙකු බඳවා ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**</u>

සේවකයින් බඳවා ගැනීමේදී මීට පෙර ආණ්ඩු පාලන සමයන්හි දේශපාලන ක්‍රියාකාරීන් බඳවා ගත් බවත් මෙවර සේවකයින් බඳවා ගැනීමේ පදනම සුදුසුකම් පිළිබඳව මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බව පැවසීය.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**</u>

මේ වන විට බිබිල ප්‍රාදේශීය සභාවේ කම්කරු සේවක මණ්ඩලයෙන් 3 දෙනෙකු විශ්‍රාම යැමට නියමිතව සිටින බවත් දෙදෙනෙකු අසනීප තත්වයේ සිටින බවත් එබැවින් මෙම සේවකයන් ප්‍රමාණවත්ද වැඩිකළ යුතු වේදැයි විමසීය.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**</u>

මේ වනවිට කම්කරුවන් තිදෙනෙකු විශ්‍රාම යැමට නියමිත බවත් දෙදෙනෙකු අසනීප තත්වයෙන් පෙළෙන බවත් පැවසු අතර දැනට IMF ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුව ඇති බවත් , සභාවේ නිළධාරීන් සඳහා වැටුප් ගෙවීමට 20%ක මුදලක් දැනට යොදවන බවත් මෙම වසරේදී වැටුප් ගෙවීමට 40% ක් යෙදවීමට ඉඩ ඇතැයිද පැවසීය. දෛනික වැටුප් ගෙවන කම්කරුවන් ස්ථිර කළහොත් මෙම බඳවා ගනු ලබන කම්කරුවන් 12 දෙනාට වැටුප් ගෙවීම අපහසු නොවන බව පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සඳහා සෞඛ්‍ය කම්කරුවන් 07 දෙනෙක් හා ක්ෂේත්‍ර කම්කරුවන් 05 දෙනෙක් වශයෙන් සභා අරමුදලින් දෛනිකව වැටුප් ගෙවීමේ පදනම මත කම්කරුවන් 12 දෙනෙකු බඳවා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.10. බිබිල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ සිට පනවනු ලබන නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීතිඥ යාපා බණ්ඩාරගේ විදූෂි අප්සරා බණ්ඩාර මිය පත් කිරීම .

බිබිල ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂයේ සිට පනවනු ලබන නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බිබිල, වැගම ,2 කණුව පදිංචි නීතිඥ යාපා බණ්ඩාරගේ විදූෂි අප්සරා බණ්ඩාර මිය පත් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**</u>

බිබිල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් නඩු සඳහා පෙනී සිටින නීතිඥ සුජිත් බණ්ඩාර මහතා නඩු සඳහා පෙනී සිටීමට අකමැත්ත ප්‍රකාශ කර අත්දැයි විමසීය.

<u>**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ නඩු සඳහා පෙනී සිටි නීතිඥ සුජිත් බණ්ඩාර මහතා ඉතා හොඳින් ප්‍රාදේශීය සභාවට සේවය ලබා දුන් බවත් බිබිල හා මොණරාගල යන අධිකරණ දෙකෙහිම නඩු කටයුතු සඳහා යොදවා ගැනීමට පහසු බැවින් නීතිඥ වයි.බී. විදූෂි අප්සරා බණ්ඩාර මහත්මිය බඳවා ගැනීමට තීරණය කළ බව පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**05.01.11.සිරිසගබෝ මාවතේ යාර 400ට වැඩි වරිපනම් ඒකක කපා හැරීම සම්බන්ධවයි.**</u>

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය අංක 2314 හා 2023/01/05 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත. එම ගැසට් නිවේදනය අනුව බිබිල මඩකලපුව ප්‍රධාන මාර්ගයේ අඹගොල්ල හන්දිය දක්වා ප්‍රධාන මාර්ගයේ සිට යාර 400ක් තෙක් දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

සිරිසගබෝ මාවතේ වරිපනම් ගෙවන සමහර බදු කරුවන් යාර 400 සීමාව ද ඉක්මවා පදිංචි වී සිටින අයගෙන් වරිපනම් අය කරන බැවින් එය ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.ඒ අනුව 2025/12/23 වන දින අප විසින් යාර 400 සිමාව මැනුම් කටයුතු කර සීමාව සළකුණු කරන ලදි. ඒ අනුව සිරිසගබෝ

මාවත වම වරිපනම් අංක 77 හිමි ආර්.එම්. ගුණසේකර මයාගේ දේපල හා සිරිසඟබෝ මාවත දකුණ වරිපනම් අංක 74 හිමි ඩබ්ලිව්. සමරවික්‍රම(එම්.වී.විජේරත්න) මයාගේ දේපලවලින් (එම දේපළ ඇතුළත්ව) යාර 400 සීමාව පිහිටා ඇත.

එම නිසා සිරිසගබෝ මාවතේ වම්පස වරිපනම් අංක 91 සිට 121 දක්වාත් සිරිසගබෝ මාවත දකුණ වරිපනම් අංක 78 සිට 116 දක්වාත් සහ සිරිසගබෝ මාවත 1 පටුමඟ (වම) (වරිපනම් අංක 5,15,23,29,31) සහ සිරිසගබෝ මාවත 1 පටුමඟ (දකුණ) (වරිපනම් අංක 6,12,20,24,28) දක්වා යාර 400 සීමාව ඉක්මවා තක්සේරු කර ඇති බව නිරීක්ෂණය වූ අතර එම සිරි සඟබෝ මාවතේ යාර 400 සීමාවට අයත් නොවන වරිපනම් බදුකරුවන්ගෙන් වරිපනම් අය නොකිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.12. නව ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ ආයතන අංශය, ගිණුම් අංශය, ආදායම් අංශය යන අංශ තුන සඳහා ඡායා පිටපත් යන්ත්‍ර 03ක් මිලදී ගැනීමට අවශ්‍ය බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ ආයතන අංශය, ගිණුම් අංශය, ආදායම් අංශය යන අංශ තුන සඳහා ඡායා පිටපත් යන්ත්‍ර 01ක් මිලදී ගැනීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.13. CCTV කැමරා හා පරිගණක සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා ආයතනයක් සමඟ ගිවිසුම්ගතවීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ CCTV කැමරා හා පරිගණක අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් බිබිල සමාධි ආයතනය සමඟ ගිවිසුම් ගතවීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ CCTV කැමරා හා පරිගණක අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් බිබිල ප්‍රදේශයේ පවත්නා එකම ආයතනය බිබිල සමාධි ආයතනය බැවින් එම ආයතනය සමඟ ගිවිසුම් ගතවීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>05.01.14 මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.</u>**

2026.01.16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවේ වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා ග්‍රීස් 16Kg බකට් 06 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් 252-6355 කැබ් රථය සඳහා 215X70 R 16 වර්ගයේ ටයර් 02 ක් නැවත ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

3. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වාහන සඳහා පහත ප්‍රමාණයන්ගේ ටයර් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

    - RD 8046 ට්‍රැක්ටරයට 12.4X28 ප්‍රමාණයේ ටයර් 02
    - LO 2926 ලොරි බවුසර් රථයට 1000/20 ප්‍රමාණයේ ටයර් 02
    - LL 7517 කෘෂ කැබ් රථයට 650X16 ප්‍රමාණයේ ටයර් 02

4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් LL 6930 ටිපර් රථයේ බ්‍රේක් පද්ධතියේ දෝෂ පවතින බැවින් පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති BRAKE MASTER PUMP REPAIR KIT 01 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගෙන එම රථය අළුත්වැඩියා කිරීම.

5. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් LL 7517 කෘෂ කැබ් රථයේ CLUTCH එකෙහි දෝෂ පවතින බැවින් පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති CLUTCH MASTER PUMP 01 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

6. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් PF 7391 කැබ් රථයේ STEERING RACK REPAIR අළුත්වැඩියාව සඳහා පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති පහත සඳහන් අමතර කොටස් නියෝජිත ආයතනයෙන් මිලදී ගෙන පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුව මගින් අළුත්වැඩියා කිරීම.

    - TIE ROD END – 02
    - RACK END – 02
    - RACK MOUNT – 02

7. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් නව රථවාහන සේවා මධ්‍යස්ථානය සඳහා නව විදුලි සම්බන්ධතාවක් ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය අතරින් 40 A පොපොල් මේන් ස්විච් 02 ක් හා 40A පොපොල් RCCB 01 ක් නැවත මිල ගණන් කැඳවා ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

8. බිබිල ප්‍රාදේශීය සභාවේ දැනට පවතින ඡායා පිටපත් යන්ත්‍රය අංශ 04 සඳහාම ප්‍රමාණවත් නොවන බැවින් කාර්යාලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි කර ගැනීම සඳහා ආදායම් අංශයට නව ඡායා පිටපත් යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර මිලදී ගෙන පරිගණක

පද්ධතියට සම්බන්ධ කිරීම හා මූල්‍ය අංශයේ පවතින ඡායා පිටපත් යන්ත්‍රය පරිගණක පද්ධතිය හා ජාලගත කරමින් අළුත්වැඩියා කිරීම.

9. බිබිල ප්‍රාදේශීය සභාවේ ජල ව්‍යාපෘතියේ නව ජල සම්බන්ධතා ලබා දීමට හා නඩත්තු කටයුතු සිදුකිරීමට අවශ්‍ය පහත නල හා උපාංග ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | 20 mm PVC PIPE (PNT 14) | 300m |
| 02 | 20 mm FOUCET SOCKET | 250 NOS |
| 03 | 20 mm JOINT SOCKET | 50 NOS |
| 04 | 20 mm VALVE SOCKET | 250 NOS |
| 05 | 40 mm VALVE SOCKET | 10 NOS |
| 06 | 63 mm (2”) VALVE SOCKET | 10 NOS |
| 07 | 20 mm EQUAL TEE | 20 NOS |
| 08 | 25 mm X 20 mm TEE | 10 NOS |
| 09 | 32 mm ELBOW | 20 NOS |
| 10 | 20 mm BEND | 20 NOS |
| 11 | 25 mm X 20 mm REDUCING SOCKET | 10 NOS |
| 12 | 32 mm X 20 mm REDUCING SOCKET | 10 NOS |
| 13 | 63 mm X 20 mm CLAMP SADDLE | 10 NOS |
| 14 | THREAD SEAL TAPE (20 mm) | 20 PKT |

10. බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩපරිපාලක වශයෙන් කටයුතු කරන බී.එම්.මහේෂ් මධුෂාන් ජයසේකර මහතාට 2026 වර්ෂයේ හිමි නිල ඇඳුමට අදාළ සපත්තු ජෝඩුව හා මේස් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

11. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් එළවළු කඩකාමර 18 ක් පවතින භූමියෙහි රථවාහන මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජිත බැවින් එම කඩකාමර ඉවත් කිරීම සඳහා නීතිමය වශයෙන් බාධාවක් නොමැති බැවින් එම කඩකාමර ඉවත් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කිරීම, ගොඩනැගිල්ල තුළ අනවසර කොටස් ඉවත් කිරීම 2026.01.26 වන විට ඉවත් කිරීම, ජනවාරි මස සිට එම කඩකාමර සඳහා බිල් කිරීම් නැවැත්වීම.

12. බිබිල ප්‍රාදේශීය සභාවේ ඉදිකිරීම් සඳහා සපයා ගැනීමට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සියල්ලේ ඒකක මිල ගණන් මාස 06 කට වලංගු වන පරිදි මිල ගණන් කැඳවීම

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. ළමා උද්‍යානය සඳහා ඇතුළත්වීමේ ගාස්තුවක් අය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු ළමා උද්‍යානයේ සෙල්ලම් උපකරණවල ආරක්ෂාව සඳහා මෙන්ම එම උපකරණවල නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා, මුදල් උත්පාදනය අරමුණු කරගෙන වයස අවුරුදු 12ට වැඩි අයගෙන් ළමා උද්‍යානයට ඇතුළත්වීමේ දී ගාස්තුවක් අය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

බිබිල ළමා උද්‍යානය මේ වන විට ළමා උද්‍යානය වෙනත් උද්‍යානයක් බවට පත් වෙමින් පවතින බවත් එහි ඇති එළිමයන් අසුන්වල හා වැඩිහිටි අය සඳහා වෙන් කර ඇති ඕංචිල්ලාවල සිටිමින් තරුණ දරුවන් අශෝබන ආකාරයට හැසිරෙන බැවින් එය වලක්වා ගැනීම සඳහා පෙබරවාරි මාසයේ සිට වයස අවුරුදු 12ට වැඩි අයගෙන් ඇතුළත්වීමේ ගාස්තුවක් අය කිරීමටත් හා ඒ සඳහා උද්‍යාන භාරකරුවෙකු පත් කිරීමටද කටයුතු කිරීමට බලාපොරොත්තු වන පැවසීය. එමගින් මෙම ස්ථානය පිරිසිදුව ක්‍රමවත්ව හා විනයානුකූලව පවත්වාගෙන යාමට ද බලාපොරොත්තු වන බව පැවසීය.

මෙම ළමා උද්‍යානයට ඇතුළත් වී තරුණ දරුවන් පෙම්වතුන් ලෙස අශෝබන ලෙස හැසිරීම පාලනය කිරීම සඳහාත් ළමා සෙල්ලම් උපකරණ ආරක්ෂා කිරීම සඳහාත් උද්‍යාන භාරකරුවෙකු පත් කිරීමෙන් බලාපොරොත්තු වන බව පැවසීය.

මෙම ළමා උද්‍යානයේ මෙන්ම සංස්කෘතික මධ්‍යස්ථානයේ පිටුපසද තරුණ දරුවන් අශෝබන ලෙස හැසිරෙන බව වැඩිහිටියන් දෙමව්පියන් ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇති බැවින් මෙය පාලනය කිරීම සඳහා මෙම ක්‍රියාමාර්ගය ගැනීම සුදුසු බව පැවසීය.

යොවුන් වියේ පසුවන්නන් සඳහා උද්‍යානයක් ඉදිකිරීමට මේ වනවිට සැලසුමක් තිබෙන බවත් මූලාසනය ලෙස මෙම යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේම මෙම අශෝබන හැසිරීම් රටාවෙන් දරුවන් මුදවා ගැනීම සඳහා විනයානුකූල පරිසරයක් ගොඩනැගීම සඳහා බව පැවසීය.

**ගරු මන්ත්‍රී ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය**

ළමා උද්‍යානය යන ළමුන් සඳහා වෙන් වූ ස්ථානයක් බැවින් මුදල් අයකර හෝ අවුරුදු 12ට වැඩි තරුණ වයසේ බාණ්ඩයන් සඳහා පැවරීම සඳහා සුදුසු නොවන බවත් මෙවන් අවස්ථාවක් ලබාදීමෙන් කුඩා දරුවන්ට සෙල්ලම් කිරීමටවත් ස්ථානයක් නොලැබී යන බවත් එය දරුවන්ට කරන අසාධාරණයක් බවත් පැවසූ අතර මෙම මුදල අය කර ළමා උද්‍යානයට වැඩි වයස් පුද්ගලයින් ඇතුළත් කිරීමට නුසුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා

අවුරුදු 12ට වැඩි වයසේ දරුවන්ගෙන් ඇතුළත්වීමේ ගාස්තුවක් අයකර ළමා උද්‍යානයට ඇතුළත්වීමට අවස්ථාව ලබාදුනහොත් එම දරුවන්ට මුදල් පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් නොවන බවත් ඔවුන් එම මුදල ලබාදී උද්‍යානයට ඇතුළු වී පෙම්වතුන් ලෙස අශෝබන ලෙස හැසිරෙන විට ළමා උද්‍යානයේ සිටින කුඩා දරුවන්ද නොමග යන බව පැවසූ අතර එවිට ගාස්තු අයකිරීමෙන් සභාව ඒ සඳහා අවසර ලබා දීමක් සිදු කිරීමක් වැනි යැයි පැවසූ අතර මෙම උද්‍යානය තුළ පුවරු එල්ලීම මගින් උපදෙස් සැපයීමට කටයුතු කිරීමට සුදුසු බව පැවසීය. මුදල් ගෙවා ඇතුළු වූ බව පවසමින් උද්‍යාන භාරකරුට වුවද අවනත නොවීමට කටයුතු කරනු ඇතැයි පැවසීය.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

මෙම ළමා උද්‍යානය ආරක්ෂිත ස්ථානයක් ලෙස සලකා රාජ්‍ය ආයතනවල නිළධාරීන්ගේ අවුරුදු 12ට වැඩි හා අඩු දරුවන් ළමා උද්‍යානයේ රැඳී සිටින බව පැවසීය. මෙම දරුවන් අශෝබන ලෙස හැසිරෙන්නේ නම් ඒ අය පාලනය කිරීම සඳහා උද්‍යාන භාරකරුවෙකු පත් කර 12ට වැඩි දරුවන්ගෙන් හා වැඩිහිටියන්ගන් සාධාරණ ඇතුළත් වීමේ ගාස්තු අය කිරීම සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය

යොවුන් පරපුර සඳහා උද්‍යානයක් ස්ථාපිත කිරීමට සැලසුම් කිරීම සුදුසු බවත් ,බිබිල ළමා උද්‍යානය පාරට මුහුණලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට ජනතාව විශාල වශයෙන් ගැවසෙන ස්ථානයක් බැවින් දරුවන් ජනතාව කියනා ආකාරයට ම අශෝබන ලෙස නොහැසිරෙනු ඇතැයි තමා සිතන බවත් වෙනත් යම් ආකාරයකට අශෝබන ලෙස හැසිරේ නම් එම තත්වය පාලනය කළහැකි ආකාරයේ උද්‍යාන භාරකරුවෙකු පත් කිරීමට සුදුසු බව පැවසීය.

ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා

බිබිල ළමා උද්‍යානයෙහි අශෝබන ලෙස හැසිරෙන දරුවන් අතරේ නිකරුනේ කාලය ගත නොකරන දරුවන්ද ආරක්ෂිත ස්ථානයක් ලෙස සිටින දරුවන්ද සිටින බැවින් ඒ අයගෙන් ගාස්තු අයකිරීමට තමාද අකමැති බව පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

මූලික පියවර ලෙස 2026 පෙබරවාරි මස 01 වනදා සිට බිබිල ළමා උද්‍යානයට පැමිණෙන දරුවන් හැසිරවීම සඳහා ළමා උද්‍යානය පවිත්‍ර කරමින් එදිනෙදා නඩත්තු කරමින් විනයානුකූලව පවත්වාගෙන යමින් විධිමත්ව පවත්වාගෙන යාම අරමුණු කරගෙන උද්‍යාන භාරකරුවෙකු පත්කිරීමටත් ළමා උද්‍යානය සඳහා ඇතුළත්වීමට ගාස්තු අය නොකිරීමටත් තීරණය කරන ලදී .

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16. සමුදුන් මැදුර ආදාහනාගාර භූමියේ ඇති ගොඩනැගිල්ලේ අවමංගල්‍ය ශාලාවක් (Funeral Parlour) ආරම්භ කිරීම සම්බන්ධව

**පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන** යටතේ රේඛීය අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළ යුතුව ඇත.

ඒ අනුව ඒ සඳහා බිබිල රදළියද්ද **"සමුදුන් මැදුර"** ආදාහනාගාරයේ පිහිටි අඩක් නිම කළ ගොඩනැගිල්ලේ **අවමංගල්‍ය ශාලාවක් (Funeral Parlour)** ලෙස මෘත දේහ තැම්පත් කිරීමට සුදුසු ලෙස වැඩි දියුණු කිරීමටත් මෘත දේහය අයත් අදාල පාර්ශවය වෙත මෘත දේහ තැම්පත් කර තිබෙන කාලය තුල සංග්‍රහ කටයුතු ආදිය සිදු කිරීමේදී කුලියට ලබා දීම සඳහා

- බුෆේ සෙට් ( Buffet Set)
- ගෑස් ලිප් (Gas Cooker)
- රයිස් කුකර් (Rice Cooker )
- සාස්පාන් (Sauspan )
- නෙස්කැෆේ යන්ත්‍රය (Nescafe Machine)
- හැදි (Spoon)
- පුටු (Chair)
- මේස (Table)
- පිඟන් (Plates)
- වීදුරු කෝප්ප (Glass)

මිල දී ගැනීමටත් සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. බිබිල බස් නැවතුම්පොළෙහි උඩු මහලෙහි පොලිසිය සඳහා මුර කුටියක් ඉදිකිරීම

බිබිල නගරයේ ආරක්ෂාව උදෙසා බිබිල පොලිසියට මුර කිරීම් කටයුතු සිදු කිරීම සඳහා බිබිල බස් නැවතුම්පොළෙහි උඩු මහලෙහි මුරකුටියක් ඉදිකිරීම සඳහා රු.246,000.00ක දළ ඇස්තමේන්තුවකට යටත්ව ඉදිකිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

බිබිල බස්නැවතුම්පොළ උඩු මහලෙහි පොලීසිය සඳහා මුරකුටියක් ස්ථාපිත කිරීම සඳහා නගරයේ සිදුවන විවිධ විෂමාචාර ක්‍රියා පාලනය කළහැකි බවත් තරුණ දරුවන්ගේ අශෝබන හැසිරීම් රටා පාලනය කිරීමට මෙන්ම නගරය අපිරිසිදු කිරීම්ද පාලනය කළහැකි බව පැවසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා

පොලිස් නිළධාරීන් සඳහා මීට පෙර බස් නැවතුම්පොළ උඩුමහලෙහි මේසයක් හා පුටුවක් තබා ස්ථානයක් සකස් කර දුන්නද එම පුටුවලට පරෙවියන් වසුරු කිරීම පමණක් නොව එම මේස මත තබාගෙන ජනතාව මත්පැන් පානය කරන ස්ථානයක් බවට පත් කර ගෙන තිබුණු බවත් එබැවින් එම නිළධාරීන්ට මුර කිරීමට සුදුසු ආකාරයට මුර කුටියක් ඉදිකර දීම සුදුසු බව පැවසීය.

මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02.ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා

### 05.02.01. කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

2026.01.16 දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

01. සතොස ගොඩනැඟිල්ලේ තීන්ත ආලේප කිරීම සභාවේ සෘජු ශ්‍රමදායකත්වය යටතේ සිදු කිරීම.

02. i. බිබිල ප්‍රාදේශිය සභාවට අයත් පුවක්පැලේ කසළ අංගනයේ සවිකරනු ලබන යන්ත්‍රෝපකරණ සඳහා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීම.

ii.පුවක්පැලේ කසළ අංගනයේ මහල් ගොඩනැඟිල්ලේ බිම් මහලේ බේලර් සහ වීදුරු කපන යන්ත්‍ර සවි කිරීමට කොන්ක්‍රීට් කර දැල් සකස් කිරීම.

03. සභාව සතුව පවතින එළවළු කඩ කාමර18ක් සහිත කඩකාමර ඉවත් කර භූමියෙහි රථ වාහන නැවතුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම.

04. ආදාහනාගාරයේ ජෙනරේටරය තබන කාමරය සකස් කිරීම.

05. උඩුබුබුළ විවේකාංගනයේ අලුත් වැඩියාව රු.ලක්ෂ 2කට යටත්ව සිදු කිරීම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරීම.

- 2025.12.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.01.16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.01.16 දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ වාර්තාව

මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2025 දෙසැම්බර් මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 20,769,304.38 |
| මූලධන ලැබීම් | - රු. 15,799.10 |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 7,127,356.83 |
| මුළු ලැබීම් | - රු.27,912,460.31 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 14,508,524.74 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 2,162,954.38 |
| ණය ආපසු ගෙවීම් | - රු. 208,494.63 |
| වෙනත් වියදම් | - රු. 5,500,635.80 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු .22,380,609.55 |

**2025.12.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 16,316,090.97 |
| අක්කර බදු | - රු. 6,354.34 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 1,711,227.00 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 642,992.00 |
| කුලී මුදල් | - රු 1,643,121.17 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,964,699.72 |
| එකතුව | - රු 23,284,485.20 |

ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා ප.ව.2.15ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

## 08.වෙනත් කරුණු

වාර්ෂික ව්‍යාපාර බදු හා දැන්වීම් පුවරු සමීක්ෂණය

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.01.14 දින වාර්ෂික ව්‍යාපාර බදු හා දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර ,

| | | |
|---|---|---|
| 01. වෙළඳ ව්‍යාපාර / ව්‍යාපාර බදු ව්‍යාපාරික ස්ථාන - 92 | = | රු. 201,600.00 |
| 02.දැන්වීම් පුවරු - 14 | = | රු. 223,950.00 |
| | | රු. 425,550.00 |

ගාස්තු අය කිරීම සඳහා හඳුනා ගෙන ඇති බව ගරු සභාවට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා

බිබිල නගරයේ විශාල වශයෙන් සුනඛ ගහනය වර්ධය වී ඇති බවත් මෙම සුනඛයින් මාර්ග අවහිර කරමින් සැරිසරන නිසා වාහනවලට මෙන්ම මගී ජනතාවට මාර්ගවල ගමන් කිරීමේදී අවහිරතාවයක් ඇතිවන බැවින් අනතුරු ඇතිවිය හැකි බව පැවසූ අතර එම සුනඛගහණය අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ගයක් ගතයුතු පව පැවසීය.

අයාලේ යන ගවයින් ගහණයද බිබිල නගරයේ වර්ධනය වී ඇති බවත් බිබිල ප්‍රාදේශීය සභාව මගින් අයාලේ යන ගවයින් ඇල්ලීම සඳහා ගාස්තු වැඩි කළද මෙම ගවයින් ඇල්ලීමේ කටයුත්ත සිදු නොවන බැවින් ලස්සන නගරයක් බිහි කිරීමට බාධාවක් වන බවත් පැවසීය.මෙම ගවයින් මාර්ගවල මලමුත්‍ර දැමීම නිසා පරිසරය දූෂණය වන බවත් නගර අලංකරණයට බාධාවක් සිදුවන බවත් බිබිල නගරයේ මෙම ගවයින් අයිතිකරුවන් දෙදෙනෙකු සිටින බවත් එම පුද්ගලයින් දැනුවත් කර ගවයින් නගරයේ සංචරනය අවම කිරීමට සීමා පැනවීම සුදුසු බව පැවසීය.

බිබිල නගරයට පැමිණෙන ජනතාවගේ වාහන නතර කිරීම සඳහා ස්ථානයක් නොමැති බැවින් වාහන නතර කිරීම සඳහා රථවාහන නැවතුම්පොළක් ඉදිකිරීම සුදුසු බවත් මේ වන වට නගරයේ **වාහන නතර කිරීම තහනම්** ලෙස පොලීසිය මගින් පුවරු ගසා ඇති බැවින් වාහන නතර කිරීමට ස්ථානයක් නොමැති වීමෙන් ජනතාව විශාල කරදරයකට මුහුණපා ඇති බවත් එබැවින් ජනතාවට වාහන නතර කිරීම සඳහා ඔත්තේ ඉරට්ටේ ක්‍රමයට මාර්ගවල රථ නතර කිරීමට හෝ ක්‍රමයක් සකස් කරන්නේ නම් සුදුසු බව පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය

මීට පෙර මාර්ග දෙපස පුවරු ස්ථාපිත කරනු ලබන්නේ බිබිල ප්‍රාදේශීය සභාව මගින් බවත් මෙවර **වාහන නතර කිරීම තහනම්** පුවරු ස්ථාපිත කර ඇත්තේ මොණරාගල පොලීසිය මගින් බැවින් මෙම පුවරු ස්ථාපිත කිරීමෙන් බිබිල ප්‍රාදේශීය සභාව හැල්ලු කිරීමක් සිදුකර ඇති බව පැවසීය. මෙම පුවරු මාර්ගය දෙපස ස්ථාපිත කර ඇති බැවින් මගී ජනතාවට වාහනයක් නතර කිරීමට ස්ථානයක් නොමැතිවීම තුළින් විශාල කරදරයකට මුහුණපෑමට සිදුව ඇති බවත් පැවසීය.

සතිපොළ පහත මාලයෙහි රථවාහන නැවතුම්පොළ ආරම්භ කර, වාහන නවත්වනු ලබන කාලය අනුව ගාස්තුවක් අය කිරීමට කටයුතු කිරීමට සුදුසු බවත් එමගින් ආදායම් උත්පාදන මාර්ගයක් බිහිකර ගැනීමට හැකියාවක් ඇතිවන බවත් පැවසීය.

බිබිල සතිපොළ තුළ මත්පැන් පානය කරමින් අශෝබන ලෙස හැසිරෙන ජනතාව පිළිබඳව බිබිල පොලීසියද මැදිහත් කරගෙන නීතිමය පියවර ගත්තේ නම් නිතර පොලීසිය සතිපොළෙහි සැරිසරන්නේ නම් එම පුද්ගලයින්ගේ මෙම විෂමාචාර ක්‍රියා අඩුවන බව පැවසීය.

මන්ත්‍රීවරුන් ලෙස දිවුරුම්දී මාස 06ක් පමණ ගෙවී ගියද මේවන තෙක් හැඳුනුම්පත හා සාමදාන විනිශ්චය කරුවෙකු ලෙස දිවුරුම් දී නොමැති බැවින් එය මන්ත්‍රී අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් බවත් හැකි ඉක්මනින් හැඳුනුම්පත හා සාමදාන විනිශවයකරුවෙකු ලෙස දිවුරුම්දීම සිදු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

## ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා

බිබිල රෝහල අසළ ඇති මාර ගස දිරාපත්වී කඩා වැටීමට ආසන්න බැවින් මේ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර කපා ඉවත් කිරීමට කටයුතු කළයුතු බව පැවසීය.

## ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා

තමා හා ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා හා උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා හා ගම්වාසීන් කිහිපදෙනෙකු එක්ව 2026 ජනවාරි 03 වන පෝය දින ශ්‍රමදානයක් කරමින් කැඩීගිය අඹගොම්මන පාලමට වැලිකොට්ට යොදා තාවකාලිකව ප්‍රතිසංස්කරණය කළ අතර ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබාදීම වෙනුවෙන් ස්තූතිය පුද කරන ලදී. නැවතත් වර්ෂාව වැඩි වුවහොත් තාවකාලිකව සකස් කළ මෙම පාලම කැඩී යාමට ඉඩ ඇති බැවින් මෙම පාලම ඉදිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

පිටකුඹුර සතිපොළෙහි බඩු විකුණනු ලබන වෙළඳුන් පාර දෙපස තබා ගෙන බඩු විකුණනු ලබන අතර මෙම සතිපොළෙහි තිබෙන බෑවුම් සහිත ස්ථානය මොටර් ග්‍රේඩරය යොදා කපා පුරවන්නේ නම් මාර්ගය අවහිර නොවන බව පැවසීය. සතිපොළ කඩකාමර උඩට මාර අත්තක් වැටීමෙන් කැඩී ඇති එම කඩ කාමර යලි ඉදිකර දීමට අවශ්‍ය බවත් ගිලා බැස ඇති වැසිකිලි නැවත ඉදිකර දී සතිපොළ විධිමත් කළයුතු බවත් පැවසීය.

බිබිල නගරයේ පදික වේදිකාවේ පවත්වාගෙන යන ලොතරැයි කුඩු ඉවත් කිරීමටත්, අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කර බිබිල රෝහල ඉදිරිපිට ඇති ATM යන්ත්‍රය ඉදිරිපිට වාහන නතර කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

## ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා

බිබිල නගරයේ සුනඛ ගහනය පාලනය කිරීම සඳහා මෙම වර්ෂය තුළ වඳ සැත්කම් 500ක් සිදු කිරීමට සැලසුම් කර ඇති බවත් වාහන නැවතුම් පොළ හැකි ඉක්මණින් ආරම්භ කිරීමටත් සාකච්ඡා කරමින් සිටින බවද පැවසීය. නතරයේ ඇති ගැටලු විසඳීම සඳහා පියවර රාශියක් මේ වනවිට ගෙන ඇති බවත් ඉතා ඉක්මණින් ඒවා දැකගත හැකි බවත් පැවසීය.

## ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා

සුනකගහනය පාලනය කිරීම සඳහා වන්දාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් අයාලේ යන ගවයින් ඇල්ලීමේ වැඩසටහන ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් හැකි ඉක්මණින් වාහන නැවතුම්පොළ විවෘත කිරීමට කටයුතු කරන බවත් පැවසීය.

මේ වන විට ප්‍රවාහන හා රථ වාහන කමිටුවේදී එක මං තීරුවක වාහන නතර කිරීමට තීරණය කර ඇති බවත් පැවසූ අතර පොලීසිය මගින් ප්‍රදර්ශනය කර ඇති **වාහන නතර කිරීම තහනම්** නාම පුවරුව ඉදිරියේ වාහන නතර කිරීමේදී පොලීසිය විසින් දඩ නියම කිරීම වැරදි බවත් පැවසීය. පෙර පැවති

පාලන සමයන්හිදී මාර්ගය දෙපස වාහන නතර කිරීමට ලබා ගැනීමට අවශ්‍ය බිම් කොටස් වල විශාල ගොඩනැගිලි ඉදි කිරීමට අවසර ලබාදීම නිසා මෙම තත්වය උද්ගත වී ඇති බව පැවසීය.

ගරු මූලාසනය විසින් 2026 ජනවාරි මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2026 පෙබරවාරි මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකගතාවය මත පෙබරවාරි 17 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව ජනවාරි මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල - කා.දැ.ගැ.පි